# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development

| | | |
|---|---|---|
| මගේ අංකය / எனதுஇல / My No: DSD/HO/05/MF/01/චක්‍රලේඛ | ඔබේ අංකය / உமது இல / Your No: .................... | දිනය / திகதி / Date: 2021.12.03 |

**සමෘද්ධි ප්‍රජා මූල බැංකු චක්‍රලේඛ :- 2021/16 (නව)**

සියළුම විධායක කමිටු/ පාලක මණ්ඩල සභාපතිවරුන්,
සමෘද්ධි ප්‍රජා මූල බැංකු/ බැංකු සමිති කළමණාකරුවන් ,

**<u>සමෘද්ධි ප්‍රජා මූල බැංකු මගින් ක්‍රියාත්මක ණය වැඩසටහන් සහ ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාල පොදු උපදෙස් ඇතුලත් මෙහෙයුම් උපදෙස් මාලාව</u>**

**01.හැඳින්වීම.**

1.1 ආර්ථික, සමාජීයීය, සංස්කෘතික යන අංශයන් තුළින් සමාජයේ සියලුදෙනා අන්තර්ගත වන පූර්ණ සංවර්ධන ක්‍රියාවලිය (inclusive growth) ප්‍රවර්ධනය කිරීමට නම් ප්‍රජාව අතර දිළිඳුකම තුරන් කිරීම හා සමාජ සාධාරණත්වය සහතික කිරීම පූර්ව අවශ්‍යතාවයක් ලෙස සැලකේ. ආර්ථික, සමාජ හා සංස්කෘතික සංවර්ධනය සඳහා දායක වන එම පූර්ව අවශ්‍යතා ඉටු කිරීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට පැවරී ඇති වගකීමකි.

1.2 සමෘද්ධි ජාතික වැඩසටහන ආරම්භයේදී, ශ්‍රී ලංකාවේ දිළිඳු ජන අනුපාතය සියයට 28 ක් ලෙස පැවති අතර වර්තමානය වනවිට එය 4.1 දක්වා අඩු වී ඇත.

මෙහිදි, දුප්පත් ජනයා ඉතිරි කිරීමට නැඹුරු කිරීම හා ක්ෂුද්‍ර මූල්‍යකරණය සහ ව්‍යවසායකත්ව සංවර්ධනය තුලින් ඔවුන්ගේ ආදායම් උත්පාදන මාර්ග වැඩි දියුණු කිරීම මගින් දිළිඳුකම අඩු කිරීමට සමෘද්ධි බැංකු ජාලය තුලින් ලබාදෙන ලද දායකත්වය විශේෂ අගැයීමකට ලක්ව ඇත.

1.3 ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්ත සමෘද්ධි බැංකු 1074 සහ සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති 331 ජාලය හරහා සමෘද්ධි ප්‍රතිලාභින් ඇතුළුසමෘද්ධි බැංකු සාමාජිකයන්ගේ ආදායම් උත්පාදන ව්‍යාපෘති වෙනුවෙන් අවශ්‍ය කරන අරමුදල් ඇතුළු නිවාස, පාරිභෝගික සහ ආපදා වැනි සියලුම අවශ්‍යතා ආවරණය වන පරිදි සහනදායි, සරල ඇප සුරකුම් මත තෝරා ගත හැකි ආපසු ගෙවීම් කාලයක් සහිතසහනදායි ණය යෝජනා ක්‍රම රැසක් හඳුන්වාදී ඇත.

1.4 දැනට ක්‍රියාත්මක ණය යෝජනා ක්‍රම මගින් ණය පහසුකම් සැලසීම, ප්‍රවර්ධනය කිරීම සහ නව ණය වැඩසටහන් හඳුන්වාදීම, දැනට සලසන සේවාවන් පුළුල් කර, ණය මුදල් ලබාගැනීමට ගත වන කාලය අඩු කර, ඉතාකාර්යක්ෂම වේගවත් සේවාවක් ලබාදීම උදෙසා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සහ බැංකු සමිති කළමනාකරණ මණ්ඩල තිරණ අංක 2021/89/10, 2021/92/02 හා2021/93/03 ලබාදුන් අනුමැතිය මත මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

1.5 2021.07.15 දින නිකුත් කරන ලද, සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2021/16 මෙමඟින් අවලංගු කරන අතර, එම චක්‍රලේඛය මත ලබාදුන් ණය මුදල් සඳහා එම උපදෙස් වලංගු වේ. මින් ඉදිරියට නිකුත් කරන ණය සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2021/16 (නව) චක්‍රලේඛය උපදෙස් අනුව කටයුතු කළ යුතු බව දන්වමි.


1වනඅදියර,4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

**02. අරමුණු.**

I. සමෘද්ධි බැංකු සාමාජිකයින්ගේ ස්වයං රැකියා, කෘෂිකාර්මික, සත්ත්ව පාලන, ධීවර වැනි සියළුම ක්ෂුද්‍ර සහ කුඩා ව්‍යාපාරවල ආයෝජන හැකියාව වැඩි දියුණු කිරීමට සහ තිරසාර ජීවන තත්ත්වයක් ඇති කිරීම සහ නිවාස ඇතුළු වෙනත් අවශ්‍යතා සඳහා ණය පහසුකම් සැලසීම.

II. ඉලක්ක ගත ජන කොටස්වල කුසලතා, හැකියාවන් හා දැනුම වර්ධනය කොට ඔවුන්ගේ විභව ශක්තීන් මතු කර ගැනීමෙන් අඩු ආදායම්ලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධනයට සහායවීම.

III. යැපුම් මානසිකත්වයෙන් මිදුණු හා ස්වශක්තිය මත විශ්වාසය ගොඩ නගා ගත් ධෛර්යමත් සහ විවිධ කම්පනයන් ඉදිරියේ නොසැලෙන ජනතාවක් ගොඩ නැගීමට අවශ්‍ය පහසුකම් සැලසීම.

IV. සමෘද්ධි බැංකු ගණුදෙනුකරුවන්ගේ කෘෂිකාර්මික හා වෙනත් නිෂ්පාදන සඳහා සුදුසු වෙළඳපල සබඳතා ගොඩනැගීම.

V. දැනටමත් අවිධිමත් සහ අධික පොලී මත ණය දෙන්නන්ගේ ග්‍රහනයට ලක් වී ඇති හෝ ඔවුන්ට ගොදුරු විය හැකි දුප්පත් ජන කොටස් ණය ගැති භාවයෙන් මුදවා ගැනීමටත්, ඔවුන්ට සහනදායි ණය පහසුකම් ලබාගැනීමට ප්‍රවේශය සකස් කරදීම.

VI. දේශිය සහ ග්‍රාමීය සම්පත්, සහ දේශයට ආවේනික කර්මාන්ත රැක ගැනීම හා ප්‍රවර්ධනය සඳහා මූල්‍ය පහසුකම් සැලසීම.

VII. එක් එක් සමෘද්ධි බැංකුව, ඒවායේ සාමාජිකයින් වන සමෘද්ධිලාභීන් ඇතුළු අඩු ආදායම්ලාභීන්ට හිමිකාරිත්වය ඇති ඔවුන් විසින්ම පාලනය සිදු කරන ස්වාධීන හා තිරසාර ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයක් ලෙස ස්ථාපිත කිරීම.

03. සමෘද්ධි බැංකු ණය පහසුකම් ලබාගැනීමට සුදුසුකම් ලබන පුද්ගලයින් සහ කණ්ඩායම්.

3.1 2017 අංක 02 සමෘද්ධි නියෝග හි 8 (1) සහ (11) හි සඳහන් සමෘද්ධි ප්‍රජාමුල සංවිධානවල සාමාජිකයින්

"යම් සමෘද්ධි ප්‍රජාමුල බැංකුවක කොටස් පනතේ 25 (1) වගන්තිය යටතේ ඒ බැංකුව පිහිටවනු ලැබ ඇති ප්‍රදේශය තුල ක්‍රියාත්මක වන සමෘද්ධි ප්‍රජාමුල සංවිධානය හෝ සංවිධානවල සාමාජිකයින් විසින් දරනු ලැබිය යුතුය."

"සමෘද්ධි ප්‍රජාමුල බැංකුවක සෑම කොටස් හිමියකුම එම සමෘද්ධි ප්‍රජාමුල බැංකුවේ සාමාජිකයෙකු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ බැංකුව විසින් සපයනු ලබන ක්ෂේත්‍ර මුල්‍ය සේවා ලබාගැනීමට හිමිකම ලබන්නේය."

04. අයදුම්කරුවන් ණය ඉල්ලුම් කිරීමට සම්පුර්ණ කල යුතු සුදුසුකම්.

4.1 ණය අයදුම්කරු වයස අවුරුදු 65 නොඉක්ම වූ යහපත් කායික සහ මානසික සෞඛ්‍ය තත්ත්වයෙන් සිටිය යුතුය.

4.2 සමෘද්ධි ප්‍රජාමුල බැංකු සාමාජිකත්වය ලබාගෙන තිබීම සහ පහත පරිදි රු. 500/- සම්පුර්ණ කරන ලද කොටස් මිලදිගෙන, තිබීම. (ණය මුදල අනුමත කරනදිනට)

4.2.1 වටිනාකම රු. 200,000 හෝ ඊට අඩු ණය මුදලක් සඳහා කොටසක් රු. 500/- ක් වූ ගෙවා නිමි සම්පුර්ණ කරන ලද කොටස්වල එකතුවෙහි වටිනාකම අවම 1/10 ක් තිබීම. (ණය මුදලට සාපේක්ෂව) උදා :- ඉල්ලුම් කරන ණය මුදල රු. 75,000/- කි. සම්පුර්ණ කරන ලද කොටස් මුදල්වල වටිනාකම අවම රු. 7500/- ක් තිබිය යුතුය.

4.2.2 වටිනාකම රු. 200,000 ඉක්ම වූ ණය මුදලක් සඳහා ගෙවා නිමි කොටස්වල වටිනාකම පහත වගුවේ සඳහන් පරිදි සම්පුර්ණ කළ යුතුය.

| ණය මුදල්වල සීමාව රු. | සම්පූර්ණ කරන ලද රු. 500/- කොටස්වල වටිනාකම රු. |
|---|---|
| 200,001 – 300,000 | 22,000 |
| 300,001 – 400,000 | 24,000 |
| 400,001 – 500,000 | 25,000 |
| 500,001 – 700,000 | 30,000 |
| 700,001 – 800,000 | 35,000 |
| 800,001 – 1,000,000 | 40,000 |

ඉහත වගුවේ සඳහන් පරිදි,ඉහත කී යම් මුදල් සීමාවක් අතර ණය මුදලක් ඉල්ලුම් කිරිමේදි, එම මුදල් සීමාව තුල සම්පූර්ණ කරන ලද කොටස් වටිනාකම සහිත මුදලක් කොටස් තැන්පත් ගිණුමේ තිබිය යුතුය.

උදා :- රු. 600,000 ක ණය මුදලක් ඉල්ලුම් කරන විටක, අවම රු. 30,000/- කොටස් වටිනාකමක් කොටසක් තැන්පත් ගිණුමෙහි තිබිය යුතුය.

4.3 බැංකු සාමාජිකත්වය ලබාගෙන සති 02 ක් ඉක්මවා තිබීම.

4.4 සක්‍රිය කුඩා කණ්ඩායමක ක්‍රියාකාරි සාමාජිකයෙකුවීම.

4.5 සමෘද්ධි ප්‍රජාමුල බැංකුවකින් ලබාගත් ණය මුදලක් හිතාමතා පැහැර හැරි අයෙකු නොවීම හෝ සිතාමතා පැහැර හැරි ණය මුදලකට ඇපකරුවෙකු හෝ කුඩා කණ්ඩායම් සාමාජිකයෙකු නොවීම.

4.6 බැංකුව විසින් ඉල්ලා සිටින ඇප සුරුකුම් ඉදිරිපත් කිරීමට හැකි අයෙකුවීම

4.7 සමුහ සහ ණය සංරක්ෂණ ණය වැඩසටහන්වලට දායකවීමට කැමැත්ත ප්‍රකාශ කල අයෙකුවීම.

4.8 බැංකු සාමාජිකයා, ක්‍රියාකාරි ණය ගණුදෙනුකරුවෙක් වුව ද, ණය මුදල ඉල්ලුම් කරන අවස්ථාව වනවිට අවුරුදු 65 හෝ ඉක්මවා ඇත්නම් තනි / බද්ධ ණය ලබාදිමට නොහැක. මීට පෙර සමෘද්ධි බැංකු ණය ලබාගෙන සාර්ථක වු ව්‍යාපෘතියක් නම් පහත පරිදි කටයුතු කළ යුතුය.

I. පවත්වාගෙන ආ ව්‍යාපෘතියට සෘජුවම සම්බන්ධිත කලත්‍රයා හෝ අවිවාහක අවුරුදු 18 ඉක්ම වු දරුවෙකු සඳහා කොටස් සාමාජිකත්වය පැවැරීම සහ ඉහත කී සුදුසුකම් සපුරා ඇති විටක ණය සංස්කෘතියට අනුව ප්‍රමාණවත් ණය මුදලක් ලබාදීම සලකා බැලීම. මෙහිදි ව්‍යාපෘති වාර්තාව සහ ව්‍යාපෘතියේ ශක්‍යතාවය සලකා බලා මීට පෙර අවසානයට යෙද වු සමෘද්ධි බැංකු ණය මුදල හෝ ඊට වැඩි ණය මුදලක් ලබාදීම සලකා බැලිය හැක.

II. සාමාජිකයා නමින්, නොපියවු ණය මුදලක්/ ණය බැදිමක් ඇති විටක හෝ සමෘද්ධි සහනාධාර ලබන හෝ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක වැඩසටහනක ප්‍රතිලාභියෙකු නම් සම්පූර්ණ කරන රුපියල් 500 /-ක් වූ කොටස් එකක් (01) සමඟ සාමාජිකත්වය තවදුරටත් තිබිය යුතුය. නමුත් නව සාමාජිකයා විසින් නව ණය මුදල ඉල්ලුම් කරන ණය වැඩසටහන යටතේ මීට පෙර ලබාගත් ණය මුදලක පිටහිටි ණය මුදලක් නොතිබිය යුතුය.

III. ඉහත 4.8.1 පරිදි බඳවා ගනු ලබන නව සාමාජිකයා සඳහා නිවාස, පාරිභෝගික, ආපදා ඇතුළු අනිකුත් ණය සඳහා ද ඉල්ලුම් කල හැක.

4.9 විශේෂ අවස්ථාවක, සාමාජිකයා පමනක් හෝ සාමාජිකයා සමග කලත්‍රයා යන දෙදෙනාම පමනක් සිටින අවස්ථාවක,දෙදෙනාම අවුරුදු 65 ඉක්මවා ඇති විටක අදාල සාමාජිකයාට සුවිශේෂි වන අයුරින් ණය ගෙවීමට ඇති හැකියාව ,කායික සහ මානසික සෞඛ්‍ය සම්පන්න වීම තත්ත්වයන් සලකා සපුරා ඇති සුදුසුකම් මත පහත පරිදි නව ණය මුදලක් ලබාදිමට සලකා බැලිය හැක.

I. පවත්වා ගෙන යන ආදායම් උත්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් සහ නිවාස අවශ්‍යතා වෙනුවෙන් රු.100,000 නොඉක්මවූ ණය මුදල් ලබා දීම.

II. පාරිභෝගික, ආපදා ණය මුදලක් ලබාදීම.

05. සමෘද්ධි බැංකුව මගින් ක්‍රියාත්මක ක්ෂුද්‍ර ණය වැඩසටහන්

5.1 සමෘද්ධි ප්‍රජාමූල බැංකු මගින් ක්‍රියාත්මක කරන ණය වැඩසටහන්.

| අ.අ. | ණය වැඩසටහන | ණය සීමාවන් | | වාර්ෂික පොලි අනුපාතය % | උපරිම ආපසු ගෙවීමේ කාලය (මාස) | ලබාදෙන සහන කාලය (මාස) |
|---|---|---|---|---|---|---|
| | | ආරම්භක රු. | උපරිම රු. | | | |
| සවිබල ක්ෂුද්‍ර මූල්‍යකරණය | | | | | | |
| 01 | ජීවනෝපාය සංවර්ධන ණය Livelihood Development LoanScheme | 100,000 | 1,000,000 | 8 | 72 | 04 |
| 02 | ජීවනෝපාය සංවර්ධන චක්‍රිය අරමුදල් ණය LivelihoodDevelopment Revolving Funds Loan Scheme | 50,000 | 100,000 | 5 | 48 | 04 |
| 03 | කෘෂිකාර්මික ණය Agriculture Loan Scheme | 50,000 | 500,000 | 8 | 60 | 06 |
| 04 | නව සමෘද්ධි ව්‍යවසායකත්ව සංවර්ධන ණය New Samurdhi Entrepreneurship Development Loan Scheme | 100,000 | 1,000,000 | 7 | 72 | |
| 05 | සමෘද්ධි රන්පත Samurdhi Ranpatha Loan Scheme | 100,000 | 500,000 | 4% (සමතලා ක්‍රමයට) | 60 | 04 |
| 06 | යොවුන් දිරිය (කාර්මික/ වෘත්තිය පුහුණු)Younth Talents Loan Scheme(Technical and Vocational) | 100,000 | 500,000 | 8 | 60 | |
| 07 | යොවුන් දිරිය ව්‍යවසායක ණය(Youth Talents Entrepreneur Loan Scheme) | 100,000 | 500,000 | 7 | 60 | |
| 08 | හදිසි ව්‍යාපාරික (ක්ෂණික) ණය Business (Instant) Loan Scheme | 10,000 | 25,000 | 8 | 24 | |
| | සමාජ සංවර්ධන ක්ෂුද්‍ර මූල්‍යකරණය Social Development Microfinance | | | | | |
| 09 | සමෘද්ධි සම්පත Samurdhi Sampatha Loan Scheme | 100,000 | 500,000 | 9 | 60 | |
| 10 | සමෘද්ධි අලෝකා ණය වැඩසටහන Samurdhi Aloka Loan Scheme | | 20,000 | 4 | 36 | |
| | පාරිභෝගික ක්ෂුද්‍ර ණය Consumption Microfinance | | | | | |
| 11 | පාරිභෝගිකණය Consumption Loan Scheme | | 25,000 | 7 | 24 | |
| 12 | ආපදා ණය Distress Loan Scheme | 5000 | 25,000 | 8 | 24 | |

5.2 මෙම ණය වැඩසටහන් යටතේ, ආරම්භක ණය මුදල් සඳහන් කර ඇතත් ණයකරුගේ ඉල්ලීම, අවශ්‍යතාවය හා සපුරා ඇති සුදුසුකම් මත ආරම්භකණය මුදලට වඩා අඩු ණය මුදලක් ලබාදීමට වුවද අවස්ථාව ඇත.

5.3 ඉහත 5.1 වගුවේ ඇතුලත් ණය වැඩසටහන් මින් ඉදිරියට ක්‍රියාත්මක වන ණය වැඩසටහන් වන බැවින් එම ණය යෝජනා ක්‍රම යටතේ නව ණය මුදල් නිකුත් කළ යුතුය.

5.4 බැංකු සාමාජිකත්වය ලබාගත් සාමාජියෙකු විසින් පළමුව ණය මුදලක් ඉල්ලුම් කරන විටක, ඒ ඒ ණය වැඩසටහන් යටතේ (සමෘද්ධි රන්පත,නව සමෘද්ධි ව්‍යාවසායකත්ව සංවර්ධන ණය හැර) ආරම්භක ණය මුදලක් සටහන් කර ඇති විටක එම ණය මුදල ලබාදිය යුතුය. එනමුත් සමෘද්ධි සම්පත ණය වැඩසටහන් ණය ලබාදිමේදි ජේද අංක 5.16 3 පරිදි ද කටයුතු කල හැකිය.

5.5 මෙම චක්‍රලේඛ නිකුත් කිරිමට පෙර, සමෘද්ධි බැංකු වලින් ලබාගත් ව්‍යාපෘති ණය මුදල් ආයෝජනය කර, සාර්ථක වු ව්‍යාවසායකයින්ට ව්‍යාපෘතියේ සාර්ථකභාවය පිළිබඳ ඇගයීමක් කර, ආසන්නව ලබාගෙන ගෙවා අවසන් කරන ලද ණය මුදලට සමාන හෝ ඊට වැඩි ණය මුදලක් ලබාදීමට සලකා බැලිය හැක.

5.6 අතීතයේ දී විවිධ අවස්ථාවල සමෘද්ධි බැංකුව හරහා ණය වැඩසටහන් රැසක් හඳුන්වා දී ඇති අතර එම ණය වැඩසටහන් අතරින් සමහර ණය වැඩසටහන් දැනමත් අත්හිටුවා ඇති බැවින් ඒවා යටතේ තවදුරටත් නව ණය මුදල් නිකුත් කිරීම නොකළ යුතුය. එනමුත් තවදුරටත් අයවීමට ඇති ක්‍රියාකාරි (Active) හෝ අක්‍රිය (Non Performing) ණය සඳහා, අදාල ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස් අනුව තටයුතු කළ යුතුය. යම් ගැටලුවකදි එම චක්‍රලේඛවල උපදෙස් දී ලබා දි නොමැති අවස්ථාවල දී , මෙම චක්‍රලේඛයේ සඳහන් වන උපදෙස් මත ක්‍රියා කළ යුතුය.

5.7 මෙම චක්‍රලේඛය නිකුත් කිරීමට පෙර මුදාහල ණය සඳහා පමණක් තවදුරටත් එම අදාල චක්‍රලේඛ උපදෙස් වලංගු වන අතර, ඉන් අනතුරුව එම චක්‍රලේඛ අවලංගු කරනු ලැබේ. මෙම දින සිට මෙම 2121/16(නව) ජේද අංක 5.1 හි සඳහන් ණය වැඩසටහන් යටතේ නිකුත් කරන ණය සඳහා මෙම චක්‍රලේඛ උපදෙස් පමණක් වලංගු කරගත යුතුය.

5.8 සමෘද්ධි බැංකු මඟින් ක්‍රියාත්මක රන් ප්‍රදීප උකස් ණය, සමෘද්ධි අරුණළු ප්‍රතිමූලා අයිරා ණය, ස්වශක්ති ණය, සමෘද්ධි මිතුරුවැනි ඒ ඒ ණය වැඩසටහන් සඳහා නිකුත් කරන ලද චක්‍රලේඛ උපදෙස් තවදුරටත් වලංගු වේ.

5.9 වයස අවුරුදු 65 ට ආසන්න සාමාජිකයෙකුට ණය මුදලක් ලබාදීමේ දී, ණය මුදලෙහි ප්‍රමාණය සහ ගෙවා අවසන් කිරීමට ගිවිසුම්ගත වන කාලය පිළිබඳ සොයා බලා, ඊට අදාලව සුදුසු ණය මුදලක් ලබාදීම සහ ණය මුදල අයකර ගැනීමේ කාලය තිරණය කිරීම මෙම චක්‍රලේඛ උපදෙස්වලට යටත්ව ආපසු ගෙවීම් උපරිම කාලය තුල සලකා බැලීම පාලක මණ්ඩලයේ වගකීම වේ.

5.9 **ජීවනෝපාය සංවර්ධන ණය වැඩසටහන**

නිෂ්පාදන, සේවා, අලෙවි, කෘෂිකර්මාන්ත, ධීවර, සත්ත්ව පාලන අංශ ඇතුළු සියළුම ආදායම් උත්පාදන ව්‍යාපෘතින් සඳහා මෙම ණය වැඩසටහන යටතේ කුඩා සහ ක්ෂුද්‍ර ව්‍යාවසායකයින් සඳහා මූල්‍ය පහසුකම් සලසන අතර, ණය සංස්කෘතිය අනුව, ආරම්භක කුඩා ණය මුදලෙහි සිට ඉහලම ණය මුදල දක්වා වන ණය මුදල් ලබාගැනීමට ඔවුන්ට අවකාශ පවතී. මෙහිදි ගණුදෙනුකරුවන් සමෘද්ධි බැංකුව සමඟ ගොඩ නගාගෙන ඇති විශ්වාසනියත්වය,පෙර ගණුදෙනුවල ස්වාභවය සහ ආයෝජන කළමනාකාරිත්ව හැකියාවන් මත, මෙම ණය වැඩසටහන යටතේ ණය ලබාගැනීමට ඇති ඉඩ ප්‍රස්ථා පුළුල් කර ඇත.

### 5.10 නව සමෘද්ධි ව්‍යවසායකත්ව සංවර්ධන ණය වැඩසටහන

2021 අයවැය වැඩසටහන යටතේ, ඉතිරි කිරීම් සහ ආයෝජන සම්බන්ධ යෝජනාව අනුව නේවාසික ආර්ථික සහ ව්‍යාපාර බලගැන්වීම මූලික කරගත් අරමුණින්, පහත වැඩසටහන් 02 ක් ක්‍රියාත්මක කරනු ලබයි.

I. සමෘද්ධි ප්‍රතිලාභී පවුල් 200,000 ක් කේන්ද්‍ර කරගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථික සංවර්ධනය
II. සමෘද්ධිලාභී/ අඩු ආදායම්ලාභී තරුණ කාන්තා ව්‍යාසායකයන් 25,000 ක් ඉලක්ක කරගත් ගෘහස්ථ වෙළඳසැල් ජාලයක් ක්‍රියාත්මක කිරීම.

ඉහත වැඩසටහන් යටතේ, බල ගන්වන කුඩා / ක්ෂුද්‍ර ව්‍යවසායකයින් සඳහා පහත අවශ්‍යතා වෙනුවෙන් ණය අරමුදල් ලබාදීම සිදු කල යුතුය.

I. ව්‍යාපාරය සම්බන්ධ ගොඩනැගිලි මිලට ගැනීම/ නව ඉදිකිරීම.
II. යන්ත්‍ර සූත්‍ර / කෘෂි වාහන/ ව්‍යාපෘතිය සම්බන්ධිත වාණිජ වාහන මිලට ගැනීම
III. කාරක ප්‍රාග්ධන අවශ්‍යතා.
IV. ග්‍රාමීය කෘෂි නිෂ්පාදන එක් රැස් කරන මධ්‍යස්ථානයන් සඳහා අවශ්‍ය වන උපකරණ මිලදී ගැනීම.

### 5.11 ජීවනෝපාය චක්‍රිය අරමුදල් ණය.

මෙම ණය වැඩසටහන යටතේ ණය මුදාහැරීමට අවශ්‍ය කරන අරමුදල් ජීවනෝපාය සංවර්ධන චක්‍රිය අරමුදලින් ලබාගනී. එම අරමුදල නොඉක්මවන පරිදි, අරමුදල පදනම් කරගෙන ණය නිකුත් කල යුතුය.

මෙම ණය වැඩසටහන යටතේ එක් එක් ණය මුදලෙහි ලැබෙන මාසික පොලී ආදායමින්, 60% ක් ජීවනෝපාය චක්‍රිය අරමුදලට බැර කළ යුතු අතර, ඉතිරි 40% ලද ආදායම් - විශේෂ ව්‍යාපෘති ඉපැයීම් ගිණුමට (කේත අංක 1013) බැර කර බැංකුවේ ආදායම් ඉපැයීමක් ලෙස ගිණුම් සටහන් තැබිය යුතුය.

ජීවනෝපාය සහ බලගැන්වීම් අංශය විසින්, ණය වැඩසටහන මෙහෙයවන අතර, අවශ්‍ය උපදෙස් සහ මඟපෙන්වීම එම අංශය විසින් නිකුත් කරනු ඇත.

### 5.12 කෘෂිකාර්මික ණය

5.12.1 ගෘහ / ව්‍යාපාරික කෘෂිකාර්මික වගාවන් සඳහා ණය නිකුත් කරන අතර, ණය මුදල තීරණය කිරීමේදී, වගා කරන බිම් ප්‍රමාණය, වැය වන වියදම සහ අස්වැන්න ලැබෙන කාලය යන සාධක සලකා බැලිය යුතුය.

5.12.2 වගා බිම් සැකසීම, බීජ සහ පොහොර ඇතුළු ද්‍රව්‍ය මිලට ගැනීම සඳහා වන කාරක ප්‍රග්ධන අවශ්‍යතා, අස්වනු නෙලීම, ගබඩා කිරීම, කෘෂිකාර්මික උපකරණ මිලට ගැනීම ඇතුළු කෘෂිකාර්මික කාර්යයන් වෙනුවෙන් ද ණය ලබාදීමට හැක.

5.12.3 මෙම ණය වැඩසටහන යටතේ පහත පරිදි ණය අයකර ගැනීම සිදු කළ යුතුය.

| විස්තරය | ගෙවන ආකාරය | උපරිම සහන කාලය (මාස) |
|---|---|---|
| වී වගාව | කන්නය | 06 |
| එළවළු | කන්නය | 03 |
| ආර්තාපල්/ බීලූණු | කන්නය | 06 |
| බඩ ඉරිගු ඇතුළු ධාන්‍ය බෝග | කන්නය | 06 |
| කහ/ ඉගුරු ඇතුළු කුළුබඩු ආශ්‍රිත වගාවන් | කන්නය | 12 |
| කෙසෙල් ඇතුළු පළතුරු වගාව | කන්නය/ මාසිකව | 12 |
| සුළු අපනයන බෝග | කන්නය/ මාසිකව | 12 |
| වාණිජ බෝග (තේ, රබර්, පොල්) | මාසිකව | 12 |

5.12.4 ඉහත වගුවේ සඳහන් නොවන වෙනත් කෘෂිකාර්මික වගාවන් සඳහා ද ණය මුදල් ලබාදිය හැක. එහිදි එළදාව ලැබීමට ගතවන කාලය සහ වගාව පවතින කාලය (ජීව කාලය) සලකා බලා, ආපසු ගෙවීම් කාලය, සහන කාලය සහ ණය ගෙවීම සිදු කල යුතු ආකාරය තිරණය කිරීම බැංකු කළමනාකරු සහ පාලක මණ්ඩලයට දි ඇති උපරිම කාලය නොඉක්මන පරිදි මෙම චක්‍රලේඛ උපදෙස් වලට යටත්ව කටයුතු කිරිමට පැවරේ.

5.12.5 ව්‍යාපාරික කෘෂිකාර්මික කාර්යයන් වෙනුවෙන්, කෘෂි උපකරණ/ කෘෂි වාහන / යන්ත්‍ර සූත්‍ර/ ගබඩා පහසුකම්/ තාක්ෂණික මෙවලම් ආදිය ලබාගැනීමේ දී, ජීවනෝපාය සංවර්ධනය,නව සමෘද්ධි ව්‍යවසාය සංවර්ධන, සමෘද්ධි රන්පත ණය වැඩසටහන් යටතේ ද ණය මුදල් ලබාදීමට හැක.

**5.13 සමෘද්ධි රන්පත ණය යෝජනා ක්‍රමය**

5.13.1 සමෘද්ධි *සියපත ණය වැඩසටහන* මින් ඉදිරියට සමෘද්ධි රන්පත *ණය වැඩසටහන ලෙස* හඳුන්වා දෙන අතර, ඒ අනුව සියලුම ගිණුම් සහ පොත්පත් මේ නමින් හැඳින්විය යුතුය. විවිධ බාධක, කම්කටොළු මැද, මඩ අතරින්, ඉහලටපැමිනිමින් ලොවට චමත්කාරය ලබාදෙන සියපතක් සේ, දුගිකම නැමැති මඩ අතර සිට දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කර ගැනීම තුලින් තිරසාර ආර්ථික මට්ටමකට ළඟා වූ සමෘද්ධිලාභි ව්‍යවසායකයින් උදෙසා මෙම ණය වැඩසටහන අලුතින්ම හඳුන්වාදෙනු ලැබේ.

5.13.2 සමෘද්ධි රන්පත ණය වැඩසටහන යටතේ, විශේෂයෙන්ම හඳුනාගත් පහත දැක්වෙන බැංකු සාමාජිකයින් සඳහා ණය පහසුකම් ලබාදීම සිදු කළ යුතුය.

I. සමෘද්ධි සහනාධාර ලැබූ පවුල් ආර්ථික වශයෙන් සවිමත්වීම නිසා ස්වේච්ඡාවෙන්ම තම සමෘද්ධි සහනාධාර පත්‍රය ආපසු භාරදෙන බැංකු සාමාජිකයින්

II. පවුල් 200,000 ක් බලගැන්වීම සඳහා වූ වැඩසටහන යටතේ බලගැන්වීමට තෝරා ගන්නා බැංකු සාමාජිකයින්.

5.13.3 වාර්ෂික පොලි අනුපාතය 4% වන අතර, සමතල ක්‍රමයට පොලි ගණනය කරන අතර, මුදාහල ණය මුදලටම වර්ෂයට පොලි ගණනය කර, ලැබෙන අගය, ගිවිසුම්ගත ආපසු ගෙවීම් වර්ෂ ගණනින් ගුණකරමුළු පොළී මුදල ගණනය කල යුතුය. මුළු පොලි මුදල් එකතුව, ගිවිසුම් ගත ආපසු ගෙවන මාස ගණනින් බෙදූ විට, එක් මාසයක පොලි මුදල සොයාගත හැක.

5.13.4 මෙම ණය වැඩසටහන සඳහා පොදු ලෙජරයේ ලැබිය යුතු ණය - සමෘද්ධි රන්පත ණය ගිණුම ( කේත අංකය 3130 ) යන බොල් ණය ගිණුම - සමෘද්ධි රන්පත ණය (කේත අංක 3229) නමින් ගිණුම් ආරම්භ කල යුතුය.

නිදසුන :-

යම් සාමාජිකයෙකු විසින්, වර්ෂ 05 ක් ඇතුලත ගෙවා අවසන් කිරීමට එකහව රු. 500,000/- ණය මුදලක් ලබාගත විටක, ගෙවිය යුතු මාසික පොලි මුදල වනුයේ,

$$\frac{500,000 \times 4 \times 5 \times 1}{100 \times 60}$$

රු. 1667 කි.

==========

මාසික ණය වාරිකය රු. 8333 කි. ඒ අනුව සෑම මසකම වාරිකය හා පොලිය වෙනුවෙන් ගණුදෙනුකරු විසින් රු. 10,000/- බැගින් තැන්පත් කළ යුතු වේ. ආපසු ගෙවීමේ කාලය මාස 60 කි.

5.13.5 සහන කාලයක් ලබාගන්නා විටක, ගිවිසුම්ගත ආපසු ගෙවීම් කාලයෙන් සහන කාලය අඩු කර, ලැබෙන අගයෙන් මුලු පොලි මුදල බෙදූ විට මාසික පොලිය සොයාගත හැක. යම් අවස්ථාවක ණයකරුවෙකු ගිවිසුම් ගත වූ කාලය නිමවීමට පෙර ණය මුදල පියවීමට ඉල්ලා සිටී නම්, ණය පියවීමට පැමිණෙන දිනට පිටහිටි මුලු ණය මුදල සහ එම මාසයට අදාල වන පොලි මුදල පමණක් අය කරගෙන බැදීම් වලින් නිදහස් කල හැක.

5.13.6 එකවර මාසික ණය වාරික කිහිපයක් ගෙවන අවස්ථාවක දී,ඉදිරියට ගෙවන වාරිකවලට අදාල(මාසවලට) පොලි මුදල අය නොකළ යුතුය.

*5.13.6 ඇප සුරැකුම් සහ අනිකුත් උපදෙස් සඳහා මෙම චක්‍රලේඛ උපදෙස් වලංගු කරගත යුතුය.*

5.13.7 මෙම ණය වැඩසටහන් යටතේ පවත්වාගෙන යන ලෙජර්, රෙජිස්තර ඇතුලු සියලු දෑ සමෘද්ධි රන්පත නමින් සංශෝධනය කර පවත්වාගෙන යා යුතුය.

## 5.14 යොවුන් දිරිය ණය වැඩසටහන

5.14.1 සමෘද්ධි බැංකු සාමාජිකයින්ගේ අවිවාහක දරුවන්උසස් අධ්‍යාපනය හෝ වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා යොමු කර, වෘත්තිය දැනුමක් ලබාදීමත්, ඉන් අනතුරුව ආදායම් උත්පාදන කාර්යයන් හරහා නව ව්‍යාවසායකයින් බිහි කිරීම මේ මඟින් අපේක්ෂා කෙරේ.

5.14.2 බැංකු සාමාජිකයා නමින් ණය නිකුත් කල යුතුවේ.

5.14.3 රජයේ හෝ රජයේ ලියාපදිංචි වෘත්තීය අධ්‍යාපන ආයතන මගින් මෙහෙයවන පාඨමාලා සඳහා ගාස්තු සහ වෙනත් ප්‍රායෝගික පුහුණුව සඳහා දැරීමට සිදුවන ගාස්තු සඳහා මෙම ණය වැඩසටහනින් ණය මුදල් වශයෙන් ලබාදීම සිදු කරයි.

5.14.4 අධ්‍යාපනය හදාරන දරුවා වෙනුවෙන් බැංකු සාමාජිකයා වෙත ණය ලබාදෙන අතර, උපරිම රු. 500,000/-ක ණය මුදලක් කණ්ඩායම් ඇපය මත ලබාදිය හැක.

5.14.5 උසස් හෝ තාක්ෂණික අධ්‍යාපනය සඳහා තෝරාගත් බවට ලිපිය සමඟ පුහුණු පාඨමාලා ගාස්තුව සඳහා වූ ලියවිලි ණය ඉල්ලීම සමඟ ඉදිරිපත් කල යුතුය.

5.14.6 මාස 06 ක් හෝ ඊට වැඩි කාලයක් පවතින පාඨමාලා සඳහා පමණක් ණය මුදල් නිකුත් කළ යුතුය.

## 5.15 හදිසි ව්‍යාපාරික (ක්ෂණික) ණය වැඩසටහන.

5.15.1 කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් ණය ලබාදෙන අතර, සිල්ලර වෙළඳාම, ජංගම වෙළඳාම වැනි ආදායම් උත්පාදන කාර්යයන් සඳහා ණය ලබාදිය හැක.

5.15.2 උත්සව සමය වෙනුවෙන් සහ ආගමික ස්ථාන හෝ යම් ස්ථානවල ආරම්භ කරන, ප්‍රදර්ශන, වෙළඳ පොලවල් වැනි අවස්ථා මූලික කරගෙන අලෙවි/ ව්‍යාපාර කටයුතුවල නියැලෙන අයට මෙම ණය වැඩසටහන යටතේ ණය පහසුකම් සැලසිය හැක.

5.15.3 මාසිකව හෝ එකවර ණය මුදල පියවීමට ණයකරුවන්ට අවස්ථාව සලසා දෙනු ලැබේ.

## 5.16 ගෘහ ඒකක යටිතල පහසුකම් (සමෘද්ධි සම්පත) ණය වැඩසටහන

5.16.1 ගෘහ ඒකක යටිතල පහසුකම් ණය වැඩසටහන **"සමෘද්ධි සම්පත"** ණය වැඩසටහන ලෙස මින් ඉදිරියට හඳුන්වනු ලැබේ.

5.16.2 ණය වැඩසටහන යටතේ පහත කාරණාවන් සඳහා ණය ප්‍රදානය කරයි.

I. පදිංචිය සඳහා නිවසක් ඉදිකිරීමට ඉඩමක් මිලට ගැනීම හෝ නිවසක් සහිත ඉඩමක් මිලට ගැනීම.
II. ස්ථිර පදිංචිය සඳහා නව නිවසක් ඉදිකිරීම.
III. පදිංචි නිවස සංවර්ධනය හෝ වැඩ නිම කිරීම සහ අලුත් වැඩියාව.
IV. විදුලි/ ජල සම්බන්ධතා ලබාගැනීම.
V. සනීපාරක්ෂක කටයුතු ඇති කිරීම.

5.16.3 සමෘද්ධි බැංකු මඟින් ක්‍රියාත්මක වෙනත් ණය වැඩසටහන් යටතේ ණය මුදලක් ලබාගෙන නොමැති, බැංකු සාමාජිකයින්ට ද මෙම වැඩසටහන යටතේ ආරම්භක ණය මුදලේ සිට ඉදිරියට ණය මුදල් ලබාදිය හැක.

5.16.4 ඉඩමක් මිලට ගැනීම හෝ නව නිවසක් ඉදිකිරීමට ණය මුදල යොදන අවස්ථාවක, ණයකරු විසින් සමෘද්ධි බැංකු විසින් ක්‍රියාත්මක ආදායම් උත්පාදන ණය වැඩසටහන් යටතේ රු. 200,000 ඉක්ම වූ ණය මුදල් එකක් හෝ කිහිපයක් ලබාගෙන බැංකුව සමඟ ඇති කරගත් විශ්වාසය මත මෙම ණය වැඩසටහන යටතේ පළමු ණය මුදල රු. 500,000/- දක්වා ලබාදීමට හැකියාව ඇත. මෙහිදී ණය ආපසු ගෙවීමට ඇති හැකියාව පිළිබඳව ද සොයා බලා උපරිම ණය මුදල තීරණය කල යුතුය.

5.16.5 ඉඩමක්, නිවසක් සහිත ඉඩමක් මිලට ගැනීමේදී, සමෘද්ධි බැංකුව පිහිටි දිස්ත්‍රික්කය තුල පිහිටි ඉඩමක් විය යුතු අතර, ඉඩම ණයකරු නමින් ලියාපදිංචි විය යුතුය.

5.16.6 නව නිවසක් ඉදිකිරීමට/ සංවර්ධනය/අලුත් වැඩියා සඳහා ණය මුදල යොදන විටක අදාල ඉඩම බැංකු සාමාජිකයා හෝ කාලත්‍රයා නමින් නිරවුල් සහ බෙදා වෙන් කල ඉඩමක් විය යුතුය.

5.16.7 ජයභූමි, ස්වර්ණභූමි වැනි ඔප්පු / රජයේ බලපත්‍ර සහිත ඉඩමක් නම්, ප්‍රාදේශිය ලේකම් විසින් කැමැත්ත ලබාදුන් ලිපියක් ණය ඉල්ලීම සමඟ ඉදිරිපත් කල යුතුය.

5.16.8 ඉදිරිපත් කල යුතු ලියවිලි

I. ඉඩමක් හෝ නිවසක් මිලට ගැනීමේදී, විකුණුම්කරු ලබාදුන් විකුණුම් මිල සහිත කැමැත්ත දන්වන ලිපිය.
II. ඔප්පුවේ ඡායා පිටපතක්.
III. ණය මුදලක් ගැනිමේදී ඉදිරිපත් කල යුතු පහත ලියවිලි. (කාරණාවට අදාල ලියවිලි ලබාගැනීම ප්‍රමාණවත් වේ.)

- ❖ අනුමත කල ඔප්පුවේ මිනුම්දෝරු සැලැස්ම.
- ❖ පසුගිය වසර 30 ක කාලයකට ඉඩමේ සහතික කල පත් ඉරු සහ අනුමත කල විථී රේඛා සහතිකය ගොඩනැගිලි සැලැස්ම
- ❖ පළාත් පාලන ආයතනය නිකුත් කරන, නොපවරා ගැනීමේ සහතිකය.
- ❖ තක්සේරු වාර්තාව.
- ❖ නව නිවසක් ඉදිකිරීම / සංවර්ධනය හෝ අලුත් වැඩියාවන් සඳහා වැය ඇස්තමේන්තුවක්.
- ❖ ඉඩමට ලඟාවිය හැකි මාර්ග සටහන.

- ඉඩමක් මිලට ගැනිමේදී, පළාත් පාලන ආයතන/ ව්‍යාවස්ථාපිත ආයතන නිවසක් ඉදි කිරීමට අනුමත කරන භූමි විශාලත්වය සහිත ඉඩමක් විය යුතුය.
- ඉඩම ඇපයට තබන විටක, සමෘද්ධි බැංකුව නමින් උකස ලිවිය යුතුය.
- ඉඩමේ උකස ලියාපදිංචියට යොමු කල බවට නීතිඥයාවරයා ලබාදෙන සහතිකය මත ණය මුදල නිදහස් කල හැක.

5.17 **පාරිභෝගික ණය වැඩසටහන**

මෙම ණය වැඩසටහන යටතේ ණය ප්‍රදානය කිරිමේදී පහත උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

5.17.1 සමෘද්ධි බැංකු සාමාජිකත්වය හිමි, සමෘද්ධි බැංකුවෙන් අවම වශයෙන් එක් ණය මුදලක් හෝ ගෙන, සමුහ සංරක්ෂණ අරමුදලට දායක වී සිටින සහ ලබාගත් පාරිභෝගික ණය මුදල් ගිවිසුම්ගත ආකාරයට ගෙවන ලද සහ සමුහ සංරක්ෂණ වැඩසටහනට අදාල චක්‍රලේඛ හි සඳහන් සුදුසුකම් ලත් අයෙකුවීම මෙන්ම ණය පැහැර හැරි අයෙකු නොවීම.

5.17.2 ඉල්ලුම්කරුගේ එදිනෙදා පාරිභෝගික අවශ්‍යතා වෙනුවෙන් ණය නිකුත් කල යුතුය.

5.17.3 කුඩා කණ්ඩායම් ඇපය හෝ වෙනත් ඇප සුරැකුම් නැත.

5.17.4 කුඩා කණ්ඩායම් නායකයාගේ නිර්දේශය අවශ්‍ය නැත.

5.17.5 ප්‍රජාමුල සංවිධානය වෙනුවෙන් සභාපති හෝ ලේකම්ගේ නිර්දේශය සහ වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරි නිර්දේශය

5.17.6 බැංකු කළමනාකරු විසින් ණය මුදල නිකුත් කර, පාලක මණ්ඩල ආවරණ අනුමැතිය ලබාගත යුතුය.

5.17.7 සුදුසුකම් සහිත ණය ඉල්ලීම් සඳහා දිනක් (01)තුල ණය මුදල මුදාහැරීමට කටයුතු කළ යුතුය.

5.17.8 උපරිම ණය මුදලක් සඳහන් කර ඇතත්, පාරිභෝගික ණය සඳහා රඳවාගත් අරමුදල් ගිණුමෙහි පවතින අරමුදල් සහ ණය ඉල්ලුම අනුව ණය මුදල තිරණය කිරීමට ඉඩදෙනු ලැබේ.

5.18 යොවුන් ව්‍යවසායකත්ව ණය වැඩසටහන

- සමෘද්ධි බැංකු ජාලය සමඟ එකතු වන තරුණ තරුණියන් ගේ කුසලතා, හැකියාවන් තුලින් නව ව්‍යවසායක පරපුරක් දැයට බිහි කිරිමේ අරමුණින් මෙම ණය වැඩසටහන අලුතින්ම සමෘද්ධි බැංකුවට හඳුන්වාදීමට අදහස් කර ඇත.
- මෙමණය වැඩසටහන මඟින් සමෘද්ධි ප්‍රතිලාභින් ඇතුළු අඩු ආදායම්ලාභි පවුල්වල පහත වෘත්තිය පුහුණුව හැදැරු තරුණ තරුණියන් ඉලක්ක කර ණය ලබාදීම සිදු කල යුතුය.
  I. යොවුන් දිරිය ණය වැඩසටහන යටතේ ණය පහසුකම් ලබාගෙන වෘත්තීය පුහුණුවක් ලබාගත් අයෙකුවීම.හෝ
  II. රජයේ, රජයට අනුබද්ධ හෝ පිලිගත් ආයතනයකින් සාර්ථක වෘත්තිය පුහුණුවක් ලත් අයෙකුවීම.
  III. ඔහු/ඇය අවිවාහක අවුරුදු 18-30 අතර විය යුතුය

- ඔහු/ඇය සමෘද්ධි බැංකු සාමාජිකත්වය ලබාගෙන තිබිය යුතු අතර, දැනටමත් ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් පවත්වා ගෙන යන හෝ අලුතින් ආරම්භ කිරිමට සැලසුම් කල කුසලතා පූර්ණ ව්‍යවසායකු විය යුතුය. (ලබාගත් පුහුණුවට අදාල ව්‍යාපෘතියක්)
- උපරිම ණය මුදල රුපියල් ලක්ෂ 5 කි. වාර්ෂික පොලි අනුපාතය 7% (හීනවන ශේෂ ක්‍රමය යටතේ) උපරිම ආපසු ගෙවීම් කාලය මාස 60 ක් වේ.
- ඇප සුරකුම් ඇතුලු අනිකුත් උපදෙස් සඳහා මෙම චක්‍රලේඛ උපදෙස් වලංගු කර ගත යුතුය.
- මෙම නව ණය වැඩසටහන සඳහා පොදු ලෙජරයේ පහත ගිණුම් අආරම්භ කල යුතුය.

ලැබිය යුතු ණය ගිණුම - යොවුන්දිරිය ව්‍යවසායක -කේත අංකය3131
බොල් ණය ගිණුම- යොවුන් දිරිය ව්‍යවසායක -කේත අංකය 3230

- ණය ඉල්ලුම් කරන ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති වාර්තාවක් සකස් කර ඉදිරිපත් කල යුතු අතර වෙළෙඳපල නැඹුරුව සහ සෘජු / වක්‍රරැකියා උත්පාදන හැකියාවක් ඇති ව්‍යාපෘති වෙනුවෙන් වැඩි අවස්ථා ලබාදීම සිදු කල යුතුය.

5.19 මෙහි සඳහන් උපදෙස් වලට අනුකූලව සවිබල / සමාජ සංවර්ධන ක්ෂුද්‍ර මූල්‍යකරණ යටතේ දක්වා ඇති ණය වැඩසටහන්වල උපරිම ණය මුදල් ලබාදිමේදී, විශ්වාසනීයත්වය තහවුරු කිරීම, ව්‍යාපාරයේ ක්‍රමානුකූල නැගීටීම සහ මූලික සුදුසුකම් සපුරා ගැනීම වැනි කාරණාවන් පියවරෙන් පියවර ඉටු කර ගැනීමටඉඩ ලබාදෙමින් සමෘද්ධි බැංකු වැඩසටහනෙහි ඇති සුවිශේෂ ක්‍රමවේදය වන, ණය සංස්කෘතිය අනුව, කුඩා ණය මුදලෙහි සිට ක්‍රමක් ක්‍රමයෙන් ඉහල ණය මුදල් ලබාදීම සිදු කළ යුතුය.

6.0 ණය මුදල,ආදායම් උත්පාදන ව්‍යාපෘතිවලට සම්බන්ධිත වත්කම් අත්පත් කර ගැනීම වෙනුවෙන් ආයෝජනය කරන විටක අනුගමනය කල යුතු උපදෙස්.

6.1

| වත්කම හි ස්වරූපය | සුරකුමහි ස්වභාවය | උපරිම ආපසු ගෙවීම් කාලය (මාස ) | උපරිම ණය මුදල තිරණය කිරිම | |
|---|---|---|---|---|
| | | | තක්සේරුව/ ඉන්වොයිස් වටිනාකම | තක්සේරුව/ ඉන්වොයිසිය ලබාගත යුතු ආයතනය/ පුද්ගලයා |
| රථ වාහන<br><br>ලියාපදිංචි නොකල (Brand New/ Unregister) සහ පාවිච්චි කරන ලද වාහන | මිලදී ගන්නා වාහනය ඇප සුරකුම වේ. නමුත් රු. 500,000/- අඩු ණය මුදලක් ලබාදෙන විටක, කුඩා කණ්ඩායම් ඇපය මත ණය ලබාදිය හැක. | 60 | ලියාපදිංචි නොකල වාහන සඳහා 80% ක් ද,<br>පාවිච්චි කරන ලද වාහන සඳහා 75% | ආනයනකරු/ බලයලත් වෙළඳ නියෝජිත නිකුත් කරන ඉන්වොයිසිය/ පාවිච්චි කරන ලද වාහන සඳහා බලයලත් තක්සේරුකරුවෙක් නිකුත් කරන සහතිකය |
| නව යන්ත්‍ර සූත්‍ර | රු. 500,000 දක්වා කුඩා කණ්ඩායම් ඇප මත ද, රු.500,001 සිට ඉහල ණය මුදලකදී, මිලදී ගන්නා වත්කම හෝ පුද්ගල ඇප | 60 | 80% | ආනයනකරු/ නිෂ්පාදකයා / බලයලත් වෙළඳ නියෝජිත නිකුත් කරන මිල ගනන් සහිත ලිපියක් |
| ඉඩම් සහ ගොඩනැගිලි මිලට ගැනීම | රු. 500,000 දක්වා කුඩා කණ්ඩායම් ඇපය / දේපල ඇපය 500,001 වැඩි දේපල මිලදී ගන්නා විටක එම දේපල සුරකුම වේ. | 72 | 100% | ප්‍රාදේශිය ලේකම්/ බලයලත් තක්සේරුකරු ලබාදෙන සහතිකය |

6.2 ණය නිකුත් කිරිමේදී, පවත්වාගෙන යන හෝ ආරම්භ කිරීමට යෝජිත ව්‍යාපෘතියට සෘජුවම සම්බන්ධිත වත්කම් මිලට ගැනීමට පමණක් ණය නිකුත් කිරීම සිදු කළ යුතුය. එමෙන්ම අලුතින්ම ආරම්භ කිරීමට යෝජිත ව්‍යාපෘතියක් සඳහා ඉහත කී වත්කම් මිලට ගැනීමට අපේක්ෂා කරන විටක, ව්‍යාපෘතියේ ශක්‍යතාවය පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම බැංකු කළමනාකරුගේ වගකීමක් වේ.

6.3 චංචල දේපල වර්ගීකරණය

6.3.1 පහත චංචල වත්කම් පමණක් සුදුසු නම්, සුරැකුම ලෙස ලබාගැනීමට පාලක මණ්ඩලයට බලය ඇත.

උදා ;

- ❖ යන්ත්‍ර උපකරණ සවිකිරීම.
- ❖ මෝටර් වාහන
- ❖ කොල මඩින යන්ත්‍ර

වටිනාකම තහවුරු කර ගැනීමසඳහා සැපයුම්කරු නිකුත් කළ මිල ගනන් සදහන් ලිපියක්, පිළිගත් තක්සේරුවෙක් නිකුත් කරන සහතිකයපිළිගත යුතුය.

6.3.2 මෝටර් රථ උකස් කර ණය ලබාදෙන විට ගත යුතු ක්‍රියාමාර්ග

- ▪ ලියාපදිංචි නොකල වාහනයක් නම්, ආනයනකරු හෝ නියෝජිත තැන ලබාදෙන මිල ගනන් මත වටිනාකම තක්සේරු කල යුතුය.
- ▪ පාවිච්චි කරන ලද, වාහනයක් නම්, තක්සේරුවෙක් ලබාදෙන වෙළඳ මිල සහිත තක්සේරු සහතිකය.
- • මෝටර් රථය උකස් කිරිම සඳහා උකස් ඔප්පුවක් සකස් කර, මෝටර් රථ ලියාපදිංචි රෙජිස්ට්‍රාල් කාර්යාලයේ ලියාපදිංචි කල යුතුය

6.4 ඉඩම් සහ දේපල මිලට ගැනීමක දී. ණය ඉල්ලුම්කරු පහත ලියවිලි/ සහතික බැංකුවට ඉදිරිපත් කල යුතුය.

I. ඉඩමේ ඔප්පුවේ සහතික පිටපතක්.
II. පළාත් පාලන ආයතනය අනුමත කරන ලද පිඹුරපත. (ඉඩමහි පිවිසුම් මාර්ගය සහිතව)
III. ඉඩමෙහි වසර 30 දක්වා පිටුපසට ලබාගත් පත් ඉරු. උධෘත - ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය නිකුත් කරන ලද.
IV. හිමිකම් වාර්තාව. (ඉඩම පිහිටි අධිකරණ බල ප්‍රදේශයේ සේවයේ නියුතු නීතිඥයෙකු සකස් කල)
V. ඉඩමට අදාල වරිපනම් තක්සේරුව සහ වරිපනම් ගෙවූ රිසිට්පත්. (ඇත්නම්)
VI. විථි රේඛාව සහ නොපවරා ගැනීම් සහතිකය - අදාල පළාත් පාලන ආයතනය නිකුත් කරනලද
VII. නඩුවකින් බෙදා වෙන් කල ඉඩමක් නම්, එම නඩු තීන්දුව.
VIII. තක්සේරු වාර්තාව.
IX. පළාත් පාලන ආයතනය අනුමත කරන ලද ගොඩනැගිලි සැලැස්ම හි පිටපතක්.

6.5 ව්‍යාපෘතියකට අදාල ගොඩනැගිල්ලක් ඉදිකිරිමට හෝ සංවර්ධනය සඳහා ණය මුදල යොදන විටක, අදාල ඉදිකිරිම් සැලැස්ම, කාර්මික නිලධාරියෙකු හෝ සුදුසු පිළිගත් ආයතනයකින් සකස් කර වැය ඇස්තමේන්තුවක් සමඟ ඉදිරිපත් කල යුතුය.

6.6 බැංකු සාමාජිකයෙකු විසින් ඉඩමක්/ නිවසක් සහිත ඉඩමක් මිලට ගැනීමට ණය මුදල යොදන විටක අදාල දිස්ත්‍රික්කය තුල පිහිටි ඉඩමක් මිලට ගැනීම සහ බැංකු සාමාජිකයා නමින් ඉඩමේ ඔප්පුව ලියාපදිංචි විය යුතුය. කුඩා කණ්ඩායම් ඇපය වෙනුවට ඉඩම සුරැකුම ලෙස ලබාගැනීමට ද ඉඩදෙනු ලැබේ.

6.7 මිලදී ගන්නා ඉඩම පළාත් පාලන ආයතන විසින්, නිවසක් ඉදිකිරීමට අනුමත කරන අවම ප්‍රමාණයෙන් විශාලත්වයක් ඇති ඉඩමක් විය යුතුය. එහිදි, ඡේද අංක 5.16.8 සඳහන් අවශ්‍ය ලියවිලි සහ සහතික ලබාගෙන පරීක්ෂා කිරීම සිදු කළ යුතුය.

## 7.0 ඇප සුරැකුම්

### 7.1 ඇප සුරැකුම්, ඇප සුරැකුම්වල සීමාවන් සහ ඒවාහි ස්වාභවය

| ණය මුදලෙහි වටිනාකම රු. | සුරැකුම් ස්වාභාවය | ණය මුදල යොදන කාරණය |
|---|---|---|
| රු. 500,000/- දක්වා | කුඩා කණ්ඩායම් ඇපය<br>ඉල්ලුම් කරන ණය මුදලට සාපේක්ෂව 25% හෝ ඊට වැඩි මුදලක්,ණය මුදල සලකා බලන දිනට සමූහ ඉතුරුම් ගිණුමෙහි තිබිය යුතුය. (ඉල්ලුම් කරන ණය මුදලෙන් ¼ සමූහ තැන්පත් ශේෂයක් තිබිය යුතුය.) | සියලුම ඉල්ලුම් කරන ණය මුදල් වෙනුවෙන් සමූහ තැන්පත් ගිණුමෙහි ශේෂය ඇපයට ලබාගත හැක. (පාරිභෝගික/ ස්වශක්ති/ සමෘද්ධි අරුණළු හැර) |
| රු. 500,001 සිට රු. 1,000,000 දක්වා | වංචල වත්කම් / නිශ්චල දේපල/ පුද්ගල ඇපය | කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් ණය මුදල යොදන විටක, රජයේ ආයතනයක සේවයේ නියුතු නිලධාරින් 02 ඇපය හෝ ආදායම් බදු දෙපාර්තමේන්තුවට ආදායම් බදු ගෙවන පුද්ගලයින් 02 දෙනෙකුගේ පුද්ගල ඇප.<br><br>වාහන/ යන්ත්‍ර සූත්‍ර වෙනුවෙන් ණය මුදල යොදන විටක, එම වංචල වත්කම/ පුද්ගලඇප සුරැකුම වේ.<br><br>ඉඩම් / දේපල මිලට ගැනීමකදී සහ ගොඩනැගිලි ඉදිකිරීම හෝ සංවර්ධනය වෙනුවෙන් ණය මුදල යොදන විටක එම නිශ්චල දේපල ඇප සුරැකුම වේ. |

7.2 සාර්ථක ව්‍යවසායෙකු හෝ ණය ගණුදෙනුකරුවෙකු නම්, රු. 500,000/- ට අඩු ණය මුදලක දී කුඩා කණ්ඩායම් ගිණුමේ ශේෂය ප්‍රමාණවත් නොවන විටක, අදාල කණ්ඩායමේ එකඟතාවය මත, නිශ්චල දේපල / වංචල වත්කම් / පුද්ගල ඇප මත ණය මුදලක් ලබාදීමේ හැකියාව ඇත. මේ යටතේ ණය මුදලක් ලබාදීමේ දී, ණය මුදල යොදන ව්‍යාපෘතියට මීට පෙර අවම රු. 100,000 වටිනාකමක් ඇති එක් ණය මුදලක් එක් ලබාගෙන, නිසි පරිදි ගෙවා අවසන් කර තිබීම සහ. රු. 100,000 ක ණය මුදලක් සඳහා තිබිය යුතු කුඩා කණ්ඩායම් තැන්පත් ශේෂයන්, සමූහ තැන්පත් ගිණුමෙහි තිබෙන

බවට සනාථ කර ගත යුතුය. තවද, ඉදිරියේදී සමූහ තැන්පත් ගිණුමේ (කුඩා කණ්ඩායම්) ශේෂය වර්ධනය කිරීම බැංකු සාමාජිකයා සහ කණ්ඩායමේ වගකීම වේ.

සමෘද්ධි සම්පත ණය වැඩසටහන යටතේ කුඩා කණ්ඩායම් ඇපය වෙනුවට නිශ්චල දේපල හෝ පුද්ගල ඇප සුරුකුම් ගත හැක.

7.3 ලබාගන්නා චංචල/ නිශ්චල ඇප සුරැකුම, සමෘද්ධි බැංකුව නමින් ලියාපදිංචි කල යුතු අතර, අදාල ලියවිලි ලියාපදිංචි කිරීමට නීතිඥ/ බලයලත්/ නියෝජිත ආයතනය විසින් අදාල ආයතනයට ලිපිගොනුව භාර දී උකස්කරය ලියාපදිංචියට යොමු කර බවට සහතිකය ලැබුනු පසු ණය නිදහස් කල හැක.

7.4 ඉඩම් සහ දේපල සුරැකුමට ලබාගැනීමේදී පහත උපදෙස් සහ සහතික ලබාගත යුතුය.

7.4.1 ඉඩම නිරවුල් සහ තනි අයිතිය ඉඩමේ ණයකරුට හෝ කලත්‍රයා සතුව තිබිය යුතුය. කාලත්‍රයා සතුව ඇතිවිටක ඔහු/ ඇය ඇපකරයට අත්සන් කල යුතුය.

7.4.2 බලපත්‍ර/ හිමිකම් පත්‍ර සහිත ඉඩම් සුරැකුමට/ ඇපයට ලබාගැනීමට පෙර ප්‍රාදේශිය ලේකම්ගේ කැමැත්ත ලබාගත යුතුය.

7.4.3 සමෘද්ධි බැංකුව පිහිටි දිස්ත්‍රික්කය තුල ඉඩම පිහිටා තිබිය යුතුය.

7.4.4 ඉඩම් සඳහා මෙම චක්‍රලේඛ ඡේද අංක 5.16.8 සඳහන් ලියවිලි / සහතික ලබාගෙන, පරීක්ෂාවෙන් අනතුරුව උකස්කරය ලියාගත යුතුය.

7.4.5 පාලක මණ්ඩල උපදෙස් මත, විනිවිද භාවය සුරකෙන පරිදි සුදුසු නීතිඥවරයෙකුගේ සේවය ලබාගැනීමට කටයුතු කළ යුතුය.

7.4.6 සුරැකුම් දේපලට අදාල උකස්කරය ලියා අත්සන් කල බවටත්, ලියාපදිංචිය සඳහා ප්‍රදේශයේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට / මෝටර් රථ ලියාපදිංචි කිරිමේ දෙපාර්තමේන්තුවට යොමු කල බවට, නීතිඥ තැනගේ ලිඛිත තහවුරුවක් ලබාගෙන, ණය මුදල නිකුත් කල හැක.

7.4.7 ණය සුරැකුම් සඳහා ලබාගත් ලියවිලි පරීක්ෂා කර, නිවැරදි බවට තහවුරු කරගෙන, ඉන් අනතුරුව උකස්කරය සමඟ සියලු ලියවිලි ද්විත්ව පාලනයට යටත්ව සුරක්ෂිතව තැබිය යුතුය.

7.4.8 ස්ථිර ගොඩනැගිල්ලක් සහිත ඉඩමක් උකස්කරයට තබාගැනීමේදී ගොඩනැගිල්ලෙහි වටිනාකම, තක්සේරු අගයට එකතු කිරීමට ඉඩදෙන සෑම විටකම ගොඩනැගිල්ල සඳහා ගිනි රක්ෂණයක් ලබාගැනීම අනිවාර්ය වේ.

7.5 රජයේ/ පළාත් පාලන/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල ස්ථිර සේවකයින්ගේ ඇපය ලබා ගැනිමේ දී පහත උපදෙස් අනුගමනය කල යුතුය.

7.5.1 ණය ඉල්ලුම් පත්‍රය සලකා බලන දිනට අදාල මාසයට පෙර මාසයේ, ඇපකරුගේ වැටුප් විස්තරය (නිසි බලධාරි සහතික කල) ලබාගැනීම.

7.5.2 ගිවිසුම්ගත වන ගෙවීම් කාලයට සමාන වූ ඉදිරි සේවා කාලයක් තිබේද? යන්න සොයා බැලීම. (විශ්‍රාම යෑමේ වෛකල්පිත වයස රජයේ චක්‍රලේඛ උපදෙස් මත අනුව)

7.5.3 ආයතන සංග්‍රහය පරිච්ඡේද XXIV සඳහන් පරිදි, මූලික වැටුප 40% හි සීමාව තුල, ණයකරුගේ මාසික ණය වාරිකය ඇතුලු සියලු අවකරණයන් කිරීමට සිදු කල යුතුය.

7.5.4 ඇපකරු, ණය මුදල ගෙවා අවසන් වීමට පෙර, විශ්‍රාමයෑම/ ඉල්ලා අස්වීම/ සේවය අත්හිටුවන අවස්ථාවක මාස 01 ක් ඇතුලත වෙනත් ඇපකරුවෙකු ඉදිරිපත් කිරීමට, ණයකරුගෙන් ලිඛිත පොරොන්දුව ලබාගැනීම.

7.6 පුද්ගල ඇපය සඳහා, ආදායම් බදු දෙපාර්තමේන්තුවට ආදායම් බදු ගෙවන පුද්ගලයකු ඉදිරිපත් කරන විටක වාර්ෂික තක්සේකරු ආදායම ණය මුදලට සමාන හෝ ඊට වැඩි විය යුතුය. දේශිය ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ආදායම් සහතිකයක මත සිදු කල යුතුය.

7.7 වාහන වැනි දෑ ඇප සුරැකුම් ලෙස තබන විටක, එහි වාර්ෂික බලපත්‍ර ලබාගැනීම සහ රක්ෂණය කිරීම හිමිකරු විසින් සිදු කළ යුතුය. ඒ සඳහා අවශ්‍ය දැනුවත් කිරීම සහ සහතික ලබාගත් බවට සනාථ කර ලබා ගැනීම බැංකු කාර්ය මණ්ඩලයේ වගකීමකි.

7.8 උකස්කරය ඇතුළු අනිකුත් ලියවිලි සකස් කිරීම සහ ලියාපදිංචිය වෙනුවෙන් දැරීමට සිදුවන වියදම් සහ නීතිඥවරයාගේ ගාස්තු ණයකරු විසින් පෞද්ගලිකව දැරිය යුතුය.

## 8.0 ණය ආපසු ගෙවීමට ලබාදෙන උපරිම කාලය

8.1 උපරිම කාලසීමාවන්

| ණය මුදල් සීමාව රු. | උපරිම ආපසු ගෙවීම් කාලය (මාස) |
|---|---|
| රු. 50,000 ට අඩු | 30 |
| රු. 50,001 සිට රු. 100,000 දක්වා | 48 |
| රු. 100,001 සිට රු. 250,000 දක්වා | 56 |
| රු. 250,001 සිට රු. 500,000 දක්වා | 60 |
| රු. 500,001 සිට රු. 1000,000 දක්වා | 72 |

8.2 ණය මුදල් සීමාවන් අනුව, උපරිම ආපසු ගෙවීම් කාලයක් සඳහන් කලද, ණයකරුගේ කැමැත්ත සහ පාලක මණ්ඩල තිරණ මත කාල සීමාව උපරිම කාලසීමාවට යටත්ව වෙනස් කිරීමට ඉඩදෙනු ලැබේ.

8.3 රථවාහන/ යන්ත්‍ර සුත්‍ර/ ඉඩම් සහ ගොඩනැගිලි මිලට ගැනිම සඳහා ණය නිකුත් කිරීමේ දී,ජේද අංක 6.1 සඳහන් උපදෙස් මත ආපසු ගෙවීම් කාලය තිරණය කල යුතුය.

8.4 හදිසි ව්‍යාපාරික, ආපදා, පාරිභෝගික, ආලෝකා ණය සඳහා දී ඇති උපරිම ණය ආපසු ගෙවීමේ කාලය තුල අයකර ගත යුතුවේ.

8.5 කෘෂිකාර්මික ණය වැඩසටහන් යටතේ, කන්න බෝග සඳහා ලබාදුන් ණය උපරිම මාස12 ඇතුලත ගෙවා අවසන් කල යුතුය. තවද එලදාව ලැබෙන කාලය මත බැංකු කළමනාකරුටද ආපසු ගෙවීම් කාලය පිළිබඳ තිරණය කිරීමට ඉඩදෙනු ලැබේ.

8.6 ගිවිසුම්ගත වූ පසුව,ආපසු ගෙවීම් කාලය වැඩි කිරීමට අවස්ථාව නැත. නමුත් කාලය අඩු කර ගැනීමට ඉඩදෙනු ලැබේ. එහි දී ණය මුදලෙහි වාරික කිහිපයක් හෝ එකවර ගිවිසුම්ගත කාලයට පෙරාතුව ගෙවීමට අවස්ථාව ඇත.

8.7 ගිවිසුම්ගත වූ කාලය තුල ණය මුදල ගෙවා අවසන් නොකරන ණයකරුවන්ට ලිඛිත ණය ගෙවීම් කාලසීමාව අවසාන වූ බවත්, පිටහිටි ණය මුදල ගෙවා අවසන් කළ යුතු බවට දැනුම්දිය යුතුය.

8.8 ණය ඉල්ලුම් කිරීමේදී, ඉදිරිපත් කල යුතු ලියවිලි.

I. ණය ඉල්ලුම් පත්‍රය - මුද්‍රිත ලිපිද්‍රව්‍ය.
II. ණය ගිවිසුම් පත්‍රය - මුද්‍රිත ලිපිද්‍රව්‍ය.
III. පොරොන්දු නෝට්ටුව - (Promissory Note ) - බැංකුව විසින් සකස් කර ගත යුතුය.
IV. ජාතික හැඳුනුම්පතහි සහතික කළ පිටපතක් (විදේශ ගමන් බලපත්‍රය/ ජ්‍යෙෂ්ඨ පුරවැසි හැඳුනුම්පත/ රියදුරු බලපත්‍රය පිටපතක් ද පිළිගත හැක.)
V. කුඩා කණ්ඩායම් ඇපය හැර වෙනත් ඇපසුරුකුමක් ඉදිරිපත් කරන විටක, අදාල ලියවිලි / සහතික/ වැටුප් විස්තර
VI. ව්‍යාපෘතියට ලඟාවිය හැකි දල මාර්ග සිතියමක් සකස් කර, ඉදිරිපත් කිරීම.
VII. අනුමත වූ ණය මුදල, සාමාජික තැන්පත් ගිණුමට තැන්පත් කරන ලෙස ඉල්ලීම් ලිපිය.

9.0 ණය ඉල්ලුම් කිරීම, නිර්දේශ සහ අනුමත කිරීම.

9.1 බැංකු සාමාජිකයා විසින්, සමෘද්ධි බැංකු කළමනාකරු/ කළමනාකරුගේ බලයලත් නිලධාරි වෙතින් මුද්‍රණය කරන ලද ණය ඉල්ලුම් පත්‍රය ලබාගෙන, ඉන් අනතුරුව සත්‍ය, නිවැරදි, තොරතුරු ඇතුලත් කර, ණය ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කල යුතුය. එහිදි සිංහල/ දෙමළ/ඉංග්‍රීසි එක් භාෂාවකින් ණය ඉල්ලුම් පත්‍ර සම්පූර්ණ කළ යුතුය. නමුත් පාරිභෝගික/ ආපදා/ හදිසි ව්‍යාපාරික ණය වැඩසටහන යටතේ ණය ලබාදීම කඩිනම් කිරීමට වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරින් වෙතින් ද ණය ඉල්ලුම් පත්‍ර ලබාගැනීමට පහසුකම් සැලසිය හැක.

9.2 ණය ඉල්ලුම් පත්‍රය සාකච්ඡා කිරීම සහ නිර්දේශ ලබාදීම.

| විස්තරය | ණය ඉල්ලුම්පත්‍රය භාරදිය යුතු පාර්ශවය | සලකා බැලිය යුතු කරුණු | නිර්දේශ ලබාදීම සිදු කරන පාර්ශවය/ නිලධාරි |
|---|---|---|---|
| <u>පළමු නිර්දේශය</u><br>කුඩා කණ්ඩායම | කුඩා කණ්ඩායම් නායකයා වෙත | I. ඉල්ලුම් පත්‍රය හි සඳහන් තොරතුරු නිවැරදි බව.<br>II. ණය මුදල යොදන ව්‍යාපෘතිය/ කාරණයෙහි සත්‍යභාවය.<br>III. සමෘද්ධි බැංකුවෙන් පෙර/ වෙනත් ලබාගත් ණය නිසි පරිදි ගෙවා/ ගෙවායන බවට සහතිකය.<br>IV. ක්‍රියාකාරි කණ්ඩායම් සාමාජිකයෙකු ද යන්න<br>V. අනිකුත් සාමාජිකයින්ගේ ඒකමතික බහුතර කැමැත්ත ලබාගැනීම. | කුඩා කණ්ඩායම් සාමාජික එකඟතාවය මත නායකයා |
| <u>දෙවන නිර්දේශය</u><br>ප්‍රජාමුල සංවිධානය | ප්‍රජාමුල සංවිධාන ලේකම් | I. මුලිකතොරතුරුවල සත්‍යභාවය පරික්ෂා කිරීම.<br>II. සඳහන් කර ඇති ව්‍යාපෘතිය/ කාරණාව සම්බන්ධ තොරතුරු නිවැරදිභාවය සොයා බැලීම.<br>III. සමෘද්ධි බැංකුව/ වෙනත් මුල්‍ය ආයතන හරහා ලබාගත් ණය | ප්‍රජාමුල සංවිධාන සභාපති/ ලේකම් |

| | | | |
|---|---|---|---|
| | | මුදල් ගෙවා ඇති / ගෙවා යන බවට සොයා බැලීම.<br>IV. සංවිධානයේ ක්‍රියාකාරි සාමාජිකයෙකු ද යන බවට<br>V. ලබාගන්නා ණය මුදල ව්‍යාපෘතිය/ කාරණාවට යොදන බවටත්, ව්‍යාපෘතිය පසු විපරම් කිරීම සහ ණය අයකර ගැනීමට හැකිද? යන්න.<br>VI. ප්‍රජාමූල සංවිධානයේ බහුතරසාමාජිකයින්ගේ එකඟතාවය ලබාගැනීම. | |
| <u>තුන්වන නිර්දේශය</u><br>වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරි | සමෘද්ධි සංවර්ධන නිලධාරි | I. ඉදිරිපත් කරන තොරතුරුවල සත්‍යභාවය<br>II. ණය මුදලක් ලබාගැනීමට අවශ්‍ය නිර්නායක/ කොන්දේසි සම්පූර්ණ කර ඇති බව සහ ඇප සුරැකුම්වල සුරක්ෂිතභාවය පිළිබඳ<br>III. ණය මුදල යොදන ව්‍යාපෘතිය/ කාරණාවෙහි සත්‍යතාවය, සහ ඉල්ලීම සාධාරණ බවත්<br>IV. කුඩා කණ්ඩායමෙහි / ප්‍රජාමූල සංවිධානයේ ක්‍රියාකාරි සාමාජිකයෙකු යන බවට,<br>V. කුඩා කණ්ඩායමෙහි/ ප්‍රජාමූලසංවිධානයේ නිර්දේශයන් ලැබී ඇති බවට<br>VI. සමෘද්ධි බැංකුවවෙතින් ලබාගත් ණය නිසි පරිදි ගෙවා ඇති/ ගෙවා යන බවට සහතිකය.<br>VII. ව්‍යාපෘතිය/ කාරණාවට ණය මුදල යොදන බවට විශ්වාසය, ව්‍යාපෘතිය පසු විපරම් කිරීම සහ ණය අයකර ගැනීම සඳහා කටයුතු කරන බව.<br>VIII. ව්‍යාපෘතිය/ ණය ඉල්ලීම පෞද්ගලිකව පරීක්ෂා කිරීම. | වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරි |

9.3 සමෘද්ධි ප්‍රජාමූල බැංකුව විසින් ණය ඉල්ලුම් පත්‍රය භාර ගැනීම, පරීක්ෂා කිරීම සහ නිර්දේශ ලබාදීම.

9.3.1 සමෘද්ධි බැංකුව වෙත ණය ඉල්ලීම ලද පසු, ණය ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කර ඇති බවට සහනිර්දේශ ලැබී ඇති බවටත්, අවශ්‍ය ලියවිලි / සහතික අමුණා ඇති බවට සනාථ කරගෙන දින මුද්‍රාව තබා **<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකුවට ලද ණය ඉල්ලුම් පත්‍ර රෙජිස්තරය</u>** (දැනට හඳුන්වා දී ඇති ආකෘතිය අනුව ) සටහන් කළ යුතුය. සමෘද්ධි බැංකුවෙහි එක් එක් ණය යෝජනා ක්‍රමය සඳහා රෙජිස්තරයක් පවත්වාගෙන යා යුතු අතර, ඉල්ලුම් පත්‍ර ලැබෙන දින අනුපිළිවෙලට සටහන් කල යුතුය. නඩත්තු කිරීම පිළිබඳ උපදෙස් රෙජිස්තරයේ පිටුපස සටහන් කර ඇත.

සමෘද්ධි බැංකු පරිගණක මෘදුකාංගය තුල මෙම රෙජිස්තරය නිර්මාණය කර ඇති බැවින් දී ඇති උපදෙස් පරිදි අවශ්‍ය තොරතුරු ඇතුලත් කිරීම පමණක් ප්‍රමාණවත් වේ.

9.3.2 ණය විෂයභාර ලිපිකරු විසින්, ණය ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු සහ ලබාදී ඇති නිර්දේශ පිළිබඳ පරීක්ෂා කල යුතුය. ඉන් අනතුරුව ණය ඉල්ලුම්කරු ණය ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබා ඇති බවට පොත්පත් ඇතුළු ලියවිලි පරීක්ෂා කර නිවැරදි බවට සනාථ කර පරීක්ෂා කල බවට සහතික කල යුතුය. පරිගණක මෘදුකාංගය යටතේ මෙහෙයුම් කටයුතු සිදු කරන බැංකු විසින්, අදාල ණයකරුගේ මුලික තොරතුරු දැනටමත් ඇතුලත් බැවින් මෘදුකාංගය ඇසුරෙන් තොරතුරු පරීක්ෂා කිරීම සහ අවශ්‍ය දත්ත සහ තොරතුරු ඇතුලත් කිරීම සිදු කල යුතුය.

9.3.3 සමෘද්ධි බැංකු කළමනාකරු විසින් ණය මුදල ආයෝජනය කරන ආදායම් උත්පාදන ව්‍යාපෘතිය/ කාරණාවන් වල ශක්‍යතාවය පරීක්ෂා කිරීම සහ ඉදිරිපත් කරන තොරතුරු සනාථ කර ගැනීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාවක්, සහ පොත්පත් පරීක්ෂා කිරීම සිදු කල යුතුය. අවශ්‍යතාවය අනුව බැංකු කාර්ය මණ්ඩලයට හෝ කලාප සහකාර වෙත ක්ෂේත්‍ර පරීක්ෂාවෙහි රාජකාරිය පැවරිය හැක.

9.3.4 ජීවනෝපාය සංවර්ධන/ කෘෂිකාර්මික/ජීවනෝපාය චක්‍රීය/ නව සමෘද්ධි ව්‍යාවසාය සංවර්ධන/ සමෘද්ධිරන්පත/යොවුන් දිරිය ව්‍යවසායකත්ව ණය යෝජනා ක්‍රම යටතේ ඉල්ලුම් කරන ණය ඉල්ලීම් සඳහා ව්‍යාපෘති වාර්තාවක් සකස් කල යුතුය. ඒ සඳහා ණය ඉල්ලුම් පත්‍රය සමග ඇති ආකෘතිය හෝ සුදුසු වෙනත් ආකෘතියක් භාවිතා කළ හැක. ව්‍යාපෘති වාර්තාව ඇසුරින් ව්‍යාපෘතියේ අනාගත තත්ත්වය, ශක්‍යතාවය, ආයෝජනය ඵලදායි වන බවට තක්සේරු කරගෙන නිර්දේශය ලබාදීම සිදු කළ යුතුය.

9.3.5 බැංකු කළමනාකරුගේ මඟ පෙන්වීම සහ උපදෙස් මත ව්‍යාපෘති වාර්තාව වසම්භාර සමෘද්ධි සංවර්ධන නිලධාරින්ගේ සහාය මත සකස් කර, බැංකුව වෙත භාරදිය යුතුය. එම වාර්තාවේ සඳහන් දෑ පිළිබඳ බැංකු කළමනාකරු/ බලයලත් නිලධාරි විසින් පරීක්ෂා කිරීම සහ අලුත් කරුණු ඇතුලත් කර, ව්‍යාපෘතිය පිළිබඳ ශක්‍යතාවය සොයාබැලීම සහ නිර්දේශ ලබාදීම සිදු කල යුතුය.

9.3.6 ණය මුදලෙහි වටිනාකම රු. 500,000/- ට වැඩි ව්‍යාපෘති/ කාරණාවන් සඳහා වු ව්‍යාපෘතිය ඇගයීම බැංකු සමිතිය පමණක් සිදු කළ යුතුය. ඒ සඳහා සකස් කරන ව්‍යාපෘති වාර්තාව බැංකු සමිතියට යොමු කල යුතු අතර, එය ලැබීමෙන් අනතුරුව බැංකු සමිති කළමනාකරු විසින් , ව්‍යාපෘති කළමනාකරු/ ව්‍යාපෘති සහකාර ලවා ව්‍යාපෘතිය පරීක්ෂා කර, පහත කරුණු පිළිබඳ ඇතුලත් වාර්තාවක් පිළියෙල කර,ඉක්මනින් බැංකුව වෙතලබාදිය යුතුය.

- ව්‍යාපෘතියේ ස්වාභාවය
- ව්‍යපෘතියේ ශක්‍යතාවය
- ණය මුදල ආයෝජන කිරීම කොතෙක් දුරට ඵලදායි යන බවට.
- වෙළඳපල තත්ත්වය
- ව්‍යාපෘතිය දියුණු කිරීමට ලබාදිය යුතු පුහුණුව/ දැනුම/ වෙනත් පහසුකම්
- ආයෝජනය කල යුතු මුදල කොපමණද යන්න (ණය මුදල) පිළිබඳ දල වටිනාකමක් (රු)
- ලබාගත යුතු සුරැකුම් පිළිබඳ යෝජනාවන්.
- ව්‍යාපෘතිය පිළිබඳ වෙනත් නිරීක්ෂණ
- කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් ලබාදෙන ණය මුදලක් නම්, පසු විපරම් කරන ආකාරය.
- අයදුම්කරුගේ වර්තමාන මුදල් ප්‍රවාහය (Cash Flow)
- ණය ආයෝජනය කිරිමෙන් පසු අනාගත මුදල් ප්‍රවාහය (Cash Flow)
- ණය වාරික හා පොලිය ගෙවීමට ප්‍රමාණවත් ආදායමක් උත්පාදනය වන්නේ ද යන්න (ණය සේවා අනුපාතය)

ඉන් අනතුරුව විධායක කමිටුවට දැන ගැනීමට ණය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ.

9.3.7 රු. 500,000/- ට අඩු, ණය ඉල්ලීම් සඳහා, ව්‍යාපෘති වාර්තා විශ්ලේෂණය කිරීම සහ ඇගයීම බැංකු කළමනාකරුට පවරන අතර, එහිදි ද ඉහත 9.3.6 සඳහන් කරුණු කෙරෙහි සොයා බැලිය යුතුය. මෙම ණය සීමාව තුල වුවද, ව්‍යාපෘති ඇගයීම බැංකු සමිතිය විසින් සිදුකරදීමට හැකි විටක එම කාර්යය සිදු කරදීම ඉතා උචිත වේ.

9.3.8 ජීවනෝපාය සංවර්ධන/ කෘෂිකාර්මික/ජීවනෝපාය චක්‍රීය/ නව සමෘද්ධි ව්‍යාවසායකත්ව සංවර්ධන/සමෘද්ධි රන්පත/යොවුන් දිරිය ව්‍යවසායකණය යෝජනා ක්‍රම හැර අනිකුත් ණය වැඩසටහන් යටතේ ණය ඉල්ලීම් සඳහා ව්‍යාපෘති වාර්තා සකස් කිරීම අත්‍යාවශ්‍ය නොවන අතර, ණය ඉල්ලීම් කාරණාව පිළිබඳ සත්‍ය තහවුරු කරගෙන, නිර්දේශය ලබාදීම සිදු කළ හැක.

9.3.9 ඉදිරිපත් කර ඇති ණය ඉල්ලීම් සඳහා ඉක්මන් ප්‍රතිචාර දක්වා කඩිනමින් ණය මුදල් නිදහස් කිරීම සිදු කල යුතුය. ඒ සඳහා බැංකු කළමනාකරුගේ බලතල වැඩි කිරීමට කටයුතු කර ඇත.එමෙන්ම උපරිම දින 14 ක් තුල ණය මුදල සම්බන්ධ තිරණය ගෙන ණයකරු දැනුවත් කල යුතුය. ඒ සඳහා අවශ්‍යතාවය මත මසකට පාලක මණ්ඩල රැස්වීම් අවම 02 ක් කැඳවිය හැක.

9.3.10. සුදුසුකම්ලත්, නිර්දේශ ලද, ඉල්ලුම් පත්‍ර සඳහා අනුමැතිය ලබාගැනීමට ණය ඉල්ලුම් පත්‍ර සමඟ ඇමුණුම් 01 ආදර්ශයට අනුව පිටපත් 02 සකස් කර පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කලයුතුය.

9.3.11. රු. 100,000/- සිට රු. 500,000/- දක්වා පරාසය තුල අවම වශයෙන් එක් (01) ණය මුදලක් ලබාගෙන ගෙවා අවසන් කල සාමාජිකයෙකුට, දැනටමත් පවත්වාගෙන යන ආදායම් උත්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් ව්‍යාපෘතියේ ශක්‍යතාවාර්තාව අනුව ඒ ඒ ණය වැඩසටහනේ උපරිම ණය මුදල දක්වාවුවත්, ණය මුදාහල හැක. පහත ණය කමිටුවේ උපදෙස් වලට යටත්ව,

9.3.12 ණය සංස්කෘතියට පරිබාහිරව එකවර ඉහල ණය මුදලක් ඉල්ලුම් කරන බැංකු සාමාජිකයින්ට ණය පහසුකම් සැලසීම උදෙසා ඉල්ලා සිටින ණය මුදල සහ ව්‍යාපෘතිය පිළිබඳ විශේෂ පරීක්ෂාවක් සිදු කර, අවශ්‍ය නිර්දේශය සහ යෝජනා ලබා ගැනීමට පහත සාමාජිකයින් ගෙන් සමන්විතප්‍රාදේශිය ණය කමිටුවට ඉදිරිපත් කළ යුතුය.

| | | |
|---|---|---|
| I. | සමෘද්ධි ප්‍රජාමුල බැංකු සමිති කළමනාකරු | - සභාපති |
| II. | ව්‍යාපෘති කළමනාකරු | - සාමාජික |
| III. | ණය ඉල්ලීම් ඉදිරිපත් කරන බැංකුවෙහි කළමනාකරු | - සාමාජික |
| IV. | නිර්දේශ ලබා දුන් වසම්භාර සමෘද්ධි සංවර්ධන නිලධාරි | - සාමාජික |
| V. | ව්‍යාපෘති සහකාර/ වෙනත් බැංකු සමිති නිලධාරියෙකු | - සාමාජික |

මෙම කමිටු රැස්වීමට බැංකු සමිති සහ බැංකු කළමනාකරු ඇතුලත් සණපුර්ණය අවම වශයෙන් 03 දෙනෙකු සිටිම අනිවාර්ය වේ. තොරතුරු රැස් කිරීම, ගොනු නඩත්තුව සහ නිර්දේශ ලබාදීම බැංකු සමිති කළමනාකරු විසින් සිදු කළ යුතුය.

ව්‍යාපෘතිය පිළිබඳ පිරික්සිමේදී පහත කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

I. ව්‍යාපෘතියේ ශක්‍යතාවය. (Project feasibility)
II. ණය ගෙවීමට ඇති කැමැත්ත. ( Willingness to Repay)
III. ණයලාභියාගේ ණය ගෙවීමට ඇති හැකියාව. (Ability to Repay)
IV. ඇප සුරැකුම.
V. මුදල් ප්‍රවාහ සටහන. (Cash Flow)
VI. ණය සේවා අනුපාතය. (Credit Service Ratio)

9.3.13ණය ඉල්ලීම් ඉදිරිපත් කිරීම සහ පාලක මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.

| ණය වැඩසටහන | අනුමැතියේ ස්වාභාවය |
|---|---|
| ජීවනෝපාය සංවර්ධන ණය/ කෘෂිකාර්මික ණය<br>රු.100,000 දක්වා<br>රු. 100,001/- සිට ඉහළ ණය මුදල් | <br>ආවරණ අනුමැතිය<br>පූර්ව අනුමැතිය |
| නව සමෘද්ධි ව්‍යවසාය සංවර්ධන ණය/ සමෘද්ධි රන්පත | පූර්ව අනුමැතිය |
| ජීවනෝපාය චක්‍රීය ණය අරමුදල්/ යොවුන් දිරිය ව්‍යවසායක | පූර්ව අනුමැතිය |
| යොවුන් දිරිය | පූර්ව අනුමැතිය |
| සමෘද්ධි සම්පත | පූර්ව අනුමැතිය |
| හදිසි ව්‍යාපාරික, ආපදා, පාරිභෝගික, සමෘද්ධි අලෝකා | ආවරණ අනුමැතිය |

9.3.14 පාලක මණ්ඩලය නියෝජනය කරන සාමාජිකයන් විසින්, තමා නියෝජනය කරන බල ප්‍රදේශයේ ණය ඉල්ලීම් පත්‍ර පිළිබඳ පූර්ව දැනුවත් භාවයකින් පැමිණිය යුතුය. එහිදීපාලක මණ්ඩල සාමාජිකයන්වැඩි දෙනාගේ එකඟතාවය මත ණය අනුමත කළ යුතුය. ණය ඉල්ලීම්වලට පහත කරුණු සඳහා සංශෝධන ද ලබාදිය හැක.

- උපරිම ණය මුදල
- ඇප සුරකුම්
- ණය ආපසු ගෙවන කාලය
- සහන කාලය
- ණය මුදාහැරීම එකවර/ කොටස් වශයෙන් ද යන්න
- ලබාදිය යුතු පුහුණුව

ඉන් අනතුරුව ඇමුණුම් 01 අනුව ඉදිරිපත් කරන ලද තිරණ පත්‍රිකාව සභාපති විසින් අත්සන් කර ආපසු බැංකු කළමනාකරු වෙත යොමු කළ යුතුය.

9.3.15 පාලක මණ්ඩල සාමාජිකයෙකු රැස්වීමට නොපැමිණි විටක ලිඛිතව දැනුම්දිය යුතු අතර, එම වසමට අදාල ණය ඉල්ලීම් සඳහා පාලක මණ්ඩලයට අනුමැතිය ලබාදීමට හැකිය. පාලක මණ්ඩල තිරණ අංකය සඳහන් කිරීමේදී, පාලක මණ්ඩලය පැවැත් වූ දිනයට අදාල වර්ෂය, මාසය සහ දිනය පළමුව ද අවසානයේ දී ණය තොරතුරු රෙජිස්තරයේ ණයකරුට ලබාදී ඇති අනු අංකය නිදසුන :- 2021/05/20/1,2,3.............9

9.3.16 ණය මුදල අනුමත කිරිමෙන් අනතුරුව,එක් එක් ණය වැඩසටහන සඳහා වෙන වෙනමණය තොරතුරු රෙජිස්තර පොත්පිළියෙල කරගෙන සටහන් තැබිය යුතුය. (ඇමුණුම් - 02 ආකෘතිය අනුව)

9.3.17 ආවරණ අනුමැතිය මත ලබාදුන් ණය මුදල් සඳහා බැංකු කළමනාකරු විසින් ආසන්නම පාලක මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතුය.

9.3.18 පාලක මණ්ඩල අනුමැතිය නොලැබුනු ණය ඉල්ලීම් පිළිබඳ ණයකරුවන්ට හේතු සහිතව දැනුම්දිය යුතුය.

10. ඇප සුරැකුම් ලබාගැනීම, ණය මුදල නිදහස් කිරීම සහ ගිණුම් සටහන තැබීම.

10.1 මෙම චක්‍රලේඛ ඡේද අංක 7.1 හිපරිදි සුදුසු ඇප සුරැකුම් ලබාගැනීම සහ ණය මුදාහැරීම සඳහා අනුගමනය කල යුතු අනිකුත් උපදෙස් .

10.1.1 කුඩා කණ්ඩායම් ඇපය ලබා ගැනීම

I. ණය ඉල්ලුම්කරු, ඇතුළු සාමාජිකයින් 05 දෙනෙකු කුඩා කණ්ඩායමේ සිටින විටක දී අනිකුත් සියළුම සාමාජිකයින් ගිවිසුමට අත්සන් කළ යුතුය.

II. ණයකරු ඇතුළු සාමාජික සංඛ්‍යාව 04දෙනෙකු සිටින විටක , අනිකුත් සාමාජිකයින් සමඟ ණයකරුගේ කලත්‍රයා/ හෝ අවුරුදු 18 ඉක්ම වූ රැකියාවක නිරත අවිවාහක දරුවෙකුද,එසේ නොමැති විටක අනිවාර්ය ඉතිරි කිරීම් ගිණුම් හිමියෙකු අතරින් එක් අයෙකු ගිවිසුමට අත්සන් තැබිය යුතුය.

III. සුවිශේෂ තත්ත්වයක් තුල, කුඩා කණ්ඩායමේ, සාමාජිකයින් 05 දෙනෙකුට වඩා සිටින විටක, සියළුම සාමාජිකයින් ගිවිසුමට බැදිය යුතු අතර, එවිට ගිවිසුමේ ඇපකරු කොටස සංශෝධනය කර භාවිතා කළ යුතුය.

IV. යම් විටෙක කුඩා කණ්ඩායම් සාමාජිකයෙකු වෙනත් ප්‍රදේශයක ස්ථිර පදිංචිය සඳහා යනවිට, කණ්ඩායමේ වෙනත් සාමාජිකයෙකුට හෝ සාමාජිකයින් කිහිප දෙනෙකු සඳහා ණය බැදීමක් ඇති විටක දිවුරුම් ප්‍රකාශයක් මඟින් බැදීම සහතික කර වෙනත් බැංකුවක සාමාජිකයෙකු වීමට ඉඩදෙනු ලැබේ. නමුත් එම බැංකුවෙන් නව ණය මුදලක් ලබාගැනීමට අයිතිවාසිකම් නැත.

V. කුඩා කණ්ඩායම් සාමාජිකයින් ගිවිසුමට බැදීම සඳහා අත්සන් ලබාගැනීම බැංකුවෙහි හෝ සුදුසු ස්ථානයකට රැස් කර සිදු කළ හැක.

10.1.2 දී ඇති උපදෙස් පරිදි, වෙනත් සුරැකුමක් ලබා ගන්නා විටක දී, කුඩා කණ්ඩායම් සාමාජිකයින්ගේ ඇප සුරැකුම අවශ්‍ය නොවේ. එනමුත් ණයකරු ණය මුදල සිතාමතා පැහැර හැරීමකදී කුඩා කණ්ඩායම ණය මුදලට නිර්දේශ ලබාදී ඇති බැවින්,එම තත්ත්වය තුළ කණ්ඩායමේ අනිකුත් සාමාජිකයින්ට ද ණය ලබා ගැනීමට නොහැක. ඒ බව පූර්ව දැනුවත් කිරීම බැංකු කාර්ය මණ්ඩලයේ වගකීමකි.

10.1.3 රාජ්‍ය සේවක ඇප ලබාගැනීමේදී,ඇපකරුවන්ගේ මූලික වැටුපෙන්40% මාසික වැටුප් අවකරණ සීමාව ගණනයේදී, ඇප වන ණය මුදලෙහි මාසික වාරිකය ද ඇතුළත් කර සීමාවන් ගණනය කල යුතුය. එමෙන්ම ණය මුදලට ඇප වූ බවට අදාල ඇපකරුවන්ගේ ආයතන ප්‍රධානියා වෙත දැනුම් දීමද සිදු කළ යුතුය.

10.1.4 චංචල/ නිශ්චල සුරැකුම් ලබාගැනීමේදී ඉහතින් ලබාදී ඇති උපදෙස් ක්‍රියාත්මකකර සමෘද්ධි ප්‍රජාමූල බැංකුව නමින් උකස්කරය/ පරම අයිතිය පවරා ගත යුතුය.

10.2 ණය සහ සමූහ සංරක්ෂණ වැඩසටහන්වලට දායක වීම. අදාල වැඩසටහන් සඳහා නිකුත් කල චක්‍රලේඛ උපදෙස් පරිදි සිදුකල යුතුය. එම වැඩසටහන් යටතේ ස්වාභාවික ආපදාවන් හෝ විපත් සිදුවූ විටක ණය මුදලට පූර්ණ රැකවරණය ලැබේ. ඒ බැවින් ණයකරුවන් දැනුවත් කර, දායක මුදල් රැස්කර ගැනීම සහ සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියට නිසි වේලාවට නිවැරදි තොරතුරු සහිතව දායක මුදල් ලබාදීම සිදුකල යුතුය. අදාල ණය සහ සමූහ සංරක්ෂණ වැඩසටහන්වලට දායක නොවන අයට ණය නිකුත් නොකල යුතුය.

තවද ණය මුදල යොදවන ව්‍යාපෘතිය කරගෙන යෑම පහත පරිදි සිදු වන විටක එනම්,

01. ණයකරු විසින් නොව, කාලත්‍රයා හෝ  තම අවිවාහක දරුවෙකු විසින් කර ගෙන යන ව්‍යාපෘතියක් සඳහා ණය මුදල යොදන අවස්ථාවක ,

උදා :- කාන්තාව බැංකු සාමාජිකයා වන අතර සැමියා හෝ තම අවිවාහක දරුවකු විසින් කරගෙන යන වඩු කර්මාන්තය හෝ වැලිගොඩ දැමීම හෝ වාහන අළුත්වැඩියා වැනි ව්‍යාපෘති.

02. ණයකරු සහ කාලත්‍රයා හෝ තම අවිවාහක දරුවෙකු සමඟ එකතු වී කරගෙන යන ව්‍යාපෘතියක් සඳහා ණය මුදල යොදන විටක,

උදා :- කාන්තාව බැංකු සාමාජිකයකු වන අතර සැමියා සමඟ එකතු වී, ආහාර පිළියෙල කර තැනින් තැනට ගොස් විකිණීම හෝ කාන්තාව විසින් මසන ඇඳුම් , සැමියා විසින් සති වෙළඳපල විකිණීම.

මෙවැනි අවස්ථාවක දී ණය සංරක්ෂණ දායක ඉල්ලීම සමඟ ලිඛිතව වෙනත් පුද්ගලයෙකු ව්‍යාපෘතිය කරගෙන යන බව හෝ දෙදෙනා එකතු වී කරගෙන යන  බවට ලිඛිතව බැංකු සමිති කළමනාකරුට දැනුම්දිය යුතුය.  ව්‍යාපෘතියේ ස්වාභාවය අනුව එවැනි ඉල්ලීම් පිළිබඳ බැංකු සමිතිය පූර්ව සොයා බැලිය යුතුය.  වන්දි ප්‍රතිලාභ ඉල්ලීමක දී ණයකරුට මෙන්ම ව්‍යාපෘතිකරුට සිදුවන මරණය/ පූර්ණ දුබලතාවයක දී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යෑමට නොහැකි විටක වන්දි ගෙවීම සිදු කල යුතුය.  මෙවැනි ව්‍යාපෘතීන් සඳහා වන ණය සංරක්ෂන ඉල්ලීම් පිලිනොගන්නා විටක, කඩිනමින් බැංකු සමිතිය දැනුම්දීම අනිවාර්ය වේ.  මේ සම්බන්ධව තවදුරටත් උපදෙස් ණය සංරක්ෂණ වැඩසටහන්ට අදාල නව චක්‍රලේඛයක් නිකුත් කරන විටක දී දැනුම්දීම සිදු කරන බව ද දන්වමි

10.3 ණය මුදල ප්‍රදානය කිරීමට පෙර ණයකරු සහ බැංකුව වෙනුවෙන් කළමනාකරු ගිවිසුම් ගත විය යුතු අතර, ඒ සඳහා මුද්‍රිත ණය ගිවිසුම් භාවිතා කළ යුතුය. ණයකරු සහ බැංකු කළමනාකරුගේ අත්සන් වලට සාක්ෂි ලෙස බැංකු කාර්ය මණ්ඩල නිලධාරියෙකු සහවෙනත් පුද්ගලයෙකු ද අත්සන් කළ යුතුය. ගිවිසුමට එළඹීමට පෙර ණයකරුට ගිවිසුමේ වගන්ති කියවා ගැනීමට හෝ කියවා දී තේරුම්ගත් පසු අත්සන් කිරීමට අවස්ථා දිය යුතුය. දැනට පවතින නීතිමය තත්ත්වය මත ගිවිසුමට පමනක් වලංගු මුද්දර මත අත්සන් කිරීම අවශ්‍ය නොවේ.

10.4 ඇමුණුම් 03සඳහන් ආකාතියඅනුව සකස් කර ගත් පොරොන්දු නෝට්ටුවක්රු. 50,000/- සිට ඉහල සියළුම ණය සඳහා ණයකරුගෙන් අත්සන් ලබා ගතයුතුය. ඒ සඳහා චක්‍රලේඛ උපදෙස් මත මුද්දර ගාස්තු ගෙවිය යුතුය.

10.5 ප්‍රදානය කරන ණය මුදල  ගිණුම්ගත කිරීමට පොදු ලෙජරයේ ගිණුමක් ආරම්භ කළ යුතුය. Manual හරහා කටයුතු කරන බැංකු, පොදු ලෙජරයේ පහත ගිණුම් ආරම්භ කළ යුතුය.  පරිගණක මෘදුකාංගය (Computer Software) හරහා මෙහෙයුම් කටයුතු සිදු කරනවිට ප්‍රධාන ගොනුව හි (Master File)  පොදු ලෙජරයේ ගිණුම් ආරම්භ කර ඇති බැවින්, මෙහිදි බැංකු කාර්ය මණ්ඩලය තෝරා ගැනීම  (Selection) සිදු කිරීම සිදු කළ යුතුය.

| ණය ගිණුමේ නම | කේත අංකය |
|---|---|
| ලැබිය යුතු - ජීවනෝපාය සංවර්ධන ණය ගිණුම | 3117 |
| ලැබිය යුතු - කෘෂිකාර්මික ණය ගිණුම | 3103 |
| ලැබිය යුතු - සමෘද්ධි රන්පත ණය ගිණුම | 3130 |
| ලැබිය යුතු - නව සමෘද්ධි ව්‍යවසායකත්ව සංවර්ධන ණය ගිණුම | 3127 |

| | |
|---|---|
| ලැබිය යුතු - යොවුන් දිරිය ණය ගිණුම | 3112 |
| ලැබිය යුතු - පාරිභෝගික ණය ගිණුම | 3104 |
| ලැබිය යුතු - ආපදා ණය ගිණුම | 3106 |
| ලැබිය යුතු - සමෘද්ධි සම්පත ණය ගිණුම | 3118 |
| ලැබිය යුතු - හදිසි ව්‍යාපාරික ණය ගිණුම | 3119 |
| ලැබිය යුතු- සමෘද්ධි ආලෝක ණය ගිණුම | 3128 |
| ලැබිය යුතු ණය ගිණුම - යොවුන් දිරිය ව්‍යවසායක | 3131 |
| ලැබිය යුතු-ජීවනෝපාය සංවර්ධන වක්‍රීය ණය ගිණුම | 3113 |

ණය මුදල ප්‍රදානය කිරීමට පෙර ණය ඉල්ලුම් පත්‍රය භාරගත් අවස්ථාවේ සිට ණය මුදල මුදාහැරීම තෙක්, ලබාදී ඇති විධාන සහ ක්‍රියා පිළිවෙත සම්පූර්ණ කර ඇති බවට බැංකු කළමනාකරු සොයා බලා නිවැරදි බවට සැහීමට පත්විය යුතුය.

10.6 සමෘද්ධි බැංකු ණය වැඩසටහන යටතේ ණය නිකුත් කිරීමට අවශ්‍ය අරමුදල් සමෘද්ධි බැංකුවේ අනිවාර්ය ඉතිරි කිරීම් තැන්පතු මුදල් හැර අනෙකුත් තැන්පතු වශයෙන් රැස්කරන අරමුදල් භාවිතා කල යුතුය. එහිදී ණය තැන්පතු අනුපාතය 80% නොඉක්මවන පරිදි ණය නිකුත් කළ යුතුය. ණය තැන්පතු අනුපාතය 80% ඉක්මවන අවස්ථාවක ප්‍රතිමූල්‍ය ණය පහසුකම් දී ඇති උපදෙස් පරිදි ප්‍රජාමූල බැංකු අංශයෙන් ලබාගැනීමට හැක. තවද, අවශ්‍යතාවය මත ග්‍රාමීය ණය අවශ්‍යතා අරමුදල් ගිණුමෙහි (කේත අංක 4033) ගිණුමෙහි පවතින අරමුදල් ද භාවිතා කර ණය දීමට හැකියාව ඇත.

10.7 ණය මුදල නිකුත් කිරීමට අදාල ගිණුම් සටහන.

ලැබිය යුතු ණය ගිණුම - ජීවනෝපාය සංවර්ධන ණය ගිණුම/
කෘෂිකාර්මික ණය ගිණුම/ පාරිභෝගික/........... ණය ගිණුම - හර
සාමාජික තැන්පත් ගිණුම - බැර

10.8 පරිගණක මෘදුකාංගය හරහා කටයුතු කිරීමේදී, ණයකරු නමින් ණය අංකයක් ස්වයංක්‍රියව නිර්මාණය වන අතර ණය මුදල ගෙවා අවසන් වනතුරු එම අංකය භාවිතා කල යුතුය. ණය මුදල් මුදාහැරීමේදී පැවරුම් පත්‍ර භාවිතා කර සාමාජික තැන්පත් ගිණුමට හරහා පමණක් ණය මුදල මුදා හැරීම සිදු කල යුතුය. පරිගණක මෘදුකාංගය හරහා ණය නිකුත් කිරීමේදී අදාල ණය ගිණුම් සහ සාමාජික තැන්පත් ගිණුම තෝරා ගෙන අදාල පැවරුම් සටහන් තැබිය යුතුය.

10.9 මාසිකව සම ණය වාරිකය වශයෙන් ගෙවීමට පොරොන්දු වූ විටක, ඇමුණුම් 04 ආදර්ශය අනුව, ණය වාරික ලේඛණයක් සකස් කර, ණය පුද්ගලික ණය ලිපිගොනුවට ඇතුලත් කල යුතු අතර, එමෙන්ම පරිගණක මෘදුකාංගය හරහා ණය අයවීම සිදුවන විට, එම ලේඛණය හරහා මාසිකව ණය වාරික අය වේ.

10.10 එසැනින්, ණයකරු නමින් අදාලතොරතුරු ඇතුලත් කර, පුද්ගලික ණය ලෙජරයක් විවෘත කර, ණය මුදාහැරීම සටහන් කළ යුතු අතර, පුද්ගලික සාමාජික තැන්පත් ලෙජරයේද තැන්පතු මුදලක් ලෙසසටහන් කළ යුතුය. පරිගණක මෘදුකාංගය හරහා ණය මුදාහැරීම සිදු කරනවිට ස්වයංක්‍රියව පුද්ගලික ණය ලෙජර් විවෘත වී සටහන් තැබීම සහ පුද්ගලික සාමාජික තැන්පත් ගිණුමට අදාල මුදල් බැරවීම සටහන් වේ.මෙම අවස්ථාවේ දී ණය තොරතුරු රෙජිස්තරයේ ද ණය මුදල මුදාහැරීම සටහන් කල යුතුය.

10.11 ඒ ඒ ණය වැඩසටහන සඳහා වෙන වෙනම ණය ගිණුම් පාලන ලෙජරය සහ පොලිය අයකර ගැනීමේ කාඩ්පතෙහි (S -02) සටහන් කල යුතුය. මෙම ලිපිද්‍රව්‍ය මුද්‍රිත ලිපිද්‍රව්‍ය ලෙස ඇණවුම් කර, බැංකුව විසින් සපයාගත යුතුය. ණය ගිණුම් පාලන ලෙජරයේ ශේෂය හර ශේෂයක් වන අතර, එම ශේෂය සැමවිටම පොදු ලෙජරයේ අදාල ණය ගිණුමෙහි පිටහිටි ශේෂය සහ පුද්ගලික ණය ලෙජර්වල ශේෂවල එකතුවට සමාන විය යුතුය. පරිගණක මෘදුකාංගය හරහා කටයුතු කිරීමේදී, ස්වයංක්‍රියව මෙම ලෙජර්වල සටහන් වන අතර, එහි නිවැරදි බව පරීක්ෂා කර තහවුරු කරගත හැක.

10.12 ණයකරුගේ පුද්ගලික සාමාජික තැන්පත් ලෙජරයේ ණය මුදල සටහන් කල පසු, ගිණුම්හිමියාට තැන්පතු මුදල් නිදහස් කර ගත හැක. පාලක මණ්ඩලය/ බැංකු කළමනාකරුට ව්‍යාපෘතිය හෝ ණය මුදල ලබාගත් කාරණය අනුව, ණය මුදල කොටස් වශයෙන් වුවත් මුදාහැරීමට ද බලය ඇත.

10.13 ණයකරුවෙකු ණය මුදල අනුමත වී දින90 ක් ඇතුලත සුරකුම් ඉදිරිපත් කර ගිවිසුම්ගතවීමට අපොහොසත් වනවිටක ණය ඉල්ලීම අවලංගු කල හැක. එමෙන්ම අදියර වශයෙන් ණය මුදලක් නිදහස් කරනවිටක, වාර්තාවල සඳහන් කාරණාවලට පරිබාහිර හෝ වෙනත් අනවශ්‍ය කාරණාවන් වෙනුවෙන් ණය මුදල් යොදා ගත් බවට හෝ වාර්තා වනවිටක ඉතිරි මුදල නිදහස් නොකර, පාලක මණ්ඩලය වෙත වාර්තා කර, ඔවුන්ගේ තිරණය මත කටයුතු කල හැක. ණය මුදල තැන්පත් ගිණුමට මාරු කල දිනට සිට අවලංගු කරන දින දක්වා පොලි මුදල අයකරගත යුතුය.

## 11.0 ණය අයකර ගැනීම සහ පසු විපරම් කිරීම.

11.1 මාසිකව/ කන්න වශයෙන් ලබාදුන් ණය මුදල් නියමිත දිනයට පොලිය සමඟ අයකිරීම සිදු කළ යුතුය. ණයකරුගේ කැමැත්ත මත, ගිවිසුම්ගතවීමේ දි පහත එක් අවස්ථාවක් තෝරාගෙන ණයකරුට ණය ආපසු ගෙවීමට ඉඩදිය යුතුය.

I. පළමු වාරිකය ණය මුදල මුදාහැරදින සිට දින 30 ක් ඉක්මවීමට පෙරාතුවද ඉන් අනතුරුව සෑම දින 30 ක් හෝ ඉක්මවීමට පෙර, අදාල කාලයට ගෙවිය යුතු පොලි මුදල සමඟ ණය මුදලෙහි මාසික වාරිකය සාමාජික තැන්පත් ගිණුමෙහි තැන්පත් කිරීම.
II. කෘෂිකාර්මික ණය වැඩටසටහන යටතේ කන්නය අවසානයේ ගෙවීම දී සම්පූර්ණ ණය මුදල සමඟ කාලයට අදාල පොලි මුදල කන්නය අවසානයට පෙරාතුම හෝ අවසන් වන දින සාමාජික තැන්පත් ගිණුමෙහි තැන්පත් කිරීම.
III. ගිවිසුම් ගත වු පරිදි නියමිත දින හෝ ඊට පෙර දිනක පැමිණ ණය වාරිකය සහ පොලිය බැංකුවහි තැන්පත් කල යුතුය..

.

11.2 සමෘද්ධි බැංකු විසින්,හීනවන ශේෂ ක්‍රමයට පොලිය ගණනයේදී, දින ගණනට පොලිය අයකරන අතර, එහිදි ණය මුදල නිදහස් කළ දිනය හෝ අවසන් වරට මාසිකණය වාරිකය ගෙවු දිනය සිට ඊළග ණය වාරික ගෙවීමට පැමිනි දිනය දක්වා ගත වු දින ගණන සොයා එම දින ගණනට පොලිය ගණනය කර, අයකර ගනී.

උදාහරණ :- “ A “ නැමැත්තා වෙත වාර්ෂික පොලි අනුපාතය 8% යටතේ රු. 50,000/- ක ණය මුදලක් 2021 මාර්තු මස 05 දින අනුමත කර, මුදාහරින ලදී. ගිවිසුම් ගත වු පරිදි සෑම මසකම 05 දින ගත වූ දින ගණනට පොලිය සමඟ මාසික ණය වාරිකය ගෙවිය යුතුය. 2021 අප්‍රේල් මස 05 දින ණය වාරිකය ගෙවීමට පැමිණි විටක, පොලි මුදල ගණනය කිරීම.

$$= \frac{50,000 \text{ X } 8 \text{ X } 30}{100\text{X } 365}$$

මාසික පොලි මුදල රු. 329/-

11.3 මාසික ණය වාරික මුදල ගණනය කිරීමේදී, ඡේද අංක 5.1 හි සඳහන් උපදෙස් පරිදි ණය මුදලනිදහස් කල දින සිට පළමු ණය වාරිකය ගෙවීමට කාලයක් ලබාදී ඇති විටකදී, එම කාලය සහන කාලය (Grace Period) වේ. ණයකරුගේ ඉල්ලීම මත පහත පරිදි ණය ගෙවීමට අවස්ථාව දෙනු ලැබේ.

1. සහන කාලයක් ලබාගෙන, ණය මුදල මාසික වාරිකය / කන්නය වශයෙන් ගෙවීම.
2. සහන කාලයක් නොමැතිව/ නොගෙන ණය මුදල වාරික වශයෙන් ගෙවීම.

සහන කාලය ලබාගන්නා විටක, ණය මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කිරීමට ගිවිසුම් ගතවන මාස ගණනින්, ලබාගන්නා සහන කාලය (මාස) අඩු කළ පසු ලැබෙන ඉතිරි මාස ගණන, ණය මුදල ගෙවා අවසන් කළ යුතු මාස ගණන වේ. එම අගයෙන් මුල් ණය මුදල බෙදූ විට, මාසික ණය වාරිකයෙහි අගය සොයා ගත හැක.

11.4 සහන කාලය ලබා නොගන්නා විටක, සම්පූර්ණයෙන්ම ණය මුදල ගෙවා අවසන් කිරීමට ගිවිසුමට බැඳෙන මාස ගණනින් මුදාහල ණය මුදල බෙදූවිට, ලැබෙන අගය මාසික ණය වාරිකයේ අගයවේ.

11.5 ණය වාරිකය සමඟ පොලි මුදල ලැබීම සටහන් කිරීමේ දී මුදල් බැර / පැවරුම් පත්‍ර භාවිතා කර පහත ගිණුම් සටහන තැබිය යුතුය.

I. සාමාජික තැන්පත් ගිණුමට මාසික වාරිකය රැස් කර ගැනීම. ඒ සඳහා සමෘද්ධි බැංකු කාර්යාලයේදී නම් මුදල් තැන්පතු පත්‍රයක් ද, ක්ෂේත්‍රයේ මුදල් රැස් කිරීමේදී, ක්ෂේත්‍ර ලැබීමක් ලෙස රැස් කර, එම මූලික ලියවිලි හරහා ගිණුම් සටහන තැබිය යුතුය.

| | |
|---|---|
| මුදල් ගිණුම | - හර |
| සාමාජික තැන්පත් ගිණුම | - බැර |

ණය අයවීමේදී සාමාජික තැන්පත් ගිණුමට පළමුව තැන්පතුව රැස් කිරීම සිදු කල යුතු වේ.

II. සාමාජික තැන්පත් ගිණුමට රැස් කිරීමෙන් අනතුරුව, ණය වාරිකය සහ නියමිත පොලි මුදල අයකර ගැනීමට, මෙහෙයුම් කටයුතු අතින් සිදු කරන විටක පැවරුම් හර සහ බැර උපයෝගි කරගෙන පහත ගිණුම් සටහන් තැබිය යුතුය.

| | |
|---|---|
| සාමාජික තැන්පත් ගිණුම | - හර |
| ලද පොලිය දුන් ණය ගිණුම | - බැර (පොලි ආදායම) |
| ලැබිය යුතු ණය ගිණුම - ජීවනෝපාය සංවර්ධනය ණය ගිණුම/ කෘෂිකාර්මික ණය ගිණුම / පාරිභෝගික... ණය ගිණුම | -බැර(ණය වාරික මුදල) |

පරිගණක මෘදුකාංගය හරහා ණය වාරිකය අයවීමේදී ස්වයංක්‍රියව අදාල දිනට, සකස් කල ණය වාරික ලැයිස්තුව ඇසුරෙන් මෙම සංසිද්ධිය සිදුවේ.

III. යම් ණයකරුවෙකු මාසය තුල ණය වාරිකය පමණක් නොව, ඉදිරි මාස කිහිපයක හෝ එකවරම පිටහිටි ණය මුදල ගෙවීමට ඉල්ලා සිටින අවස්ථාවක ණය මුදල ප්‍රදානය කල දිනය හෝ අන්තිමට ණය වාරිකය ගෙවූ දින සිට නැවත ණය වාරිකය/පිටහිටි ණය මුදල ගෙවීමට පැමිණි දින දක්වා දින ගණනට පොලිය සකස් කර අයකර ගත යුතුය.ණය මුදල ගෙවා අවසන් කිරීමදි ගිවිසුම් ගත වු දිනය දක්වා පොලි අය නොකළ යුතුය.

IV. සාමාජික තැන්පත් ගිණුම හරහා ණය වාරිකය/ ණය මුදල අයකර ගත් පසු පුද්ගලික සාමාජික තැන්පත් ගිණුම සහ පුද්ගලික ණය ගිණුම්වල සටහන් තබා, ගණුදෙනුවෙහි ප්‍රතිඵලය දැක්විය යුතුය. ණය කටයුතු පරිගණක මෘදුකාංග හරහා සිදුවන විටක, දී ඇති විධානයන්ට අනුව පුද්ගලික සාමාජික තැන්පත් සහ ණය ගිණුම්වල සටහන් ස්වයංක්‍රියව සිදුවේ.

11.6 ණය මුදලෙහි වාරිකය මාසිකව සහ කෘෂිකාර්මික ණය වලදී කන්නය අවසානයේදී ගෙවීමට ගිවිසුම්ගතවීමට ඉඩදිය යුතුය. ඒ අනුව ණය මුදල නිකුත් කල දින සිට දින 30 ක් (සහන කාලයක් නොගන්නා විටක) හෝ කන්නය අවසානයේ දී, අදාල දිනට ණය වාරික මුදල / ණය මුදල ගෙවිය යුතු වේ. එනමුත් එම දිනයේ සිට දින 07 ඇතුලත ද ණය වාරිකය ගෙවීමට සහන කාලයක් හිමිවේ. එම දින 07 ඇතුළත මාසික ණය වාරිකය/ ණය මුදල සහ පොලිය බැංකුවෙහි තැන්පත් කල යුතුය. සහන කාලය (දින 07) තුල ණය වාරිකය නොගෙවන ණයකරුවන්ට ප්‍රමාද කරන ණය වාරිකය මත 5% දඩ මුදලක් (ප්‍රමාද ගාස්තුවක්) අය කරනු ලබයි. මෙහිදි ප්‍රමාද කරන දින ගණනට දඩ අය නොකරන අතර, යම් ණයකරුවෙකුගේ සම්පූර්ණ ණය මුදල ගෙවන අවස්ථාව තෙක් අයකර ගත යුත්තේ මුදාහල ණය මුදලින් 5% ක් නොඉක්ම වන දඩ මුදලක් වේ. කන්න අවසානයේ දී ණය ගෙවීමට ලබාගත් ණය මුදලක දී, දඩ පොලිය 5% මුළු ණය මුදලටම ගැලපිය යුතුය.
යම් විටෙක, පොළිය පමනක් ගෙවා ඇතිවිටෙක දි ඇති උපදෙස් මත දඩ පොළිය අය කර ගත යුතුය.

11.7 දඩ මුදල (ප්‍රමාද ගාස්තුව) අයකර ගැනීම

පැවරුම් පත්‍ර භාවිතා කර, පහත ගිණුම් සටහන තැබීම සිදු කළ යුතු අතර, පරිගණක මෘදුකාංගය හරහා ණය අයවීමේදී, ස්වං ක්‍රියව ලබා දී ඇති විධාන අනුව දඩ මුදල අයකර ගැනීම සිදුවේ.

| | |
|---|---|
| සාමාජික තැන්පත් ගිණුම | - හර |
| ලද පොලිය - දුන් ණය ගිණුම | - බැර |

කිසිදු විටක දඩ මුදල උපචිත පදනම මත ඉදිරියට ගෙන යා නොහැක.

11.8 දිනපතා, ණය තොරතුරු රෙජිස්තරය නඩත්තු කල යුතුවේ. එහිදි අනුමත කරන ලද ණය මුදල/ මුදල් සහ මුදාහැරීම සටහන් කල යුතුවේ. එමෙන්ම වැඩ කරන සෑම දිනයකම අය විය යුතු ණය වාරිකවල එකතුව ද දිනය තුල අයකර ගත් ණය වාරිකවල මුදල් එකතුව ද අදාල තීරුවල සටහන් කර රෙජිස්තරය නඩත්තු කල යුතුය. පරිගණක මෘදුකාංගය හරහා ස්වයංක්‍රිය එම කාර්යයන් සිදුවේ. එමෙන්ම ණය සහ පොලිය අයකර ගැනීම් කාඞ්පත්‍රය සහ ණය ගිණුම් පාලන ලෙජරය ද ඒ ඒ ණය වැඩසටහන වෙනුවෙන් වෙනම දී ඇති උපදෙස් පරිදි නඩත්තු කල යුතුය.

11.9 ණයකරුවෙකු ගිවිසුම්ගත වු පරිදි අදාල දිනයට පොලි මුදල සමඟ ණය වාරික සම්පූර්ණයෙන්ම ගෙවිය යුතු අතර, නමුත් සාමාජික තැන්පත් ගිණුමේ පොලි මුදල සමඟ ණය වාරිකය අයකර ගැනීමට ප්‍රමාණවත් මුදලක් නොමැති වු විටක, පළමුව ණය පොලිය අයකර ගෙන ඉතිරි මුදලක් ඇත්නම් ණය වාරිකය හිලව් කළ යුතුය. කවර අවස්ථාවක වුවද අදාල ණයකරුගෙන් මාසිකව/ කන්නය අවසානයේ අයවිය යුතු පොලි මුදලෙන් කොටසක් පමණක් අයකර ගැනීමටඉඩ නැත. පරිගණක මෘදුකාංගයේ දී ද, තැන්පතු මුදල ප්‍රමාණවත් නොවන විටක මාසික ණය වාරිකය අයකර ගැනීමට ඉඩ දී නැත.

11.10 සමෘද්ධි බැංකුවට ගෙවිය යුතු ණය වාරිකය සහ පොලී මුදල, වසමභාර සමෘද්ධි සංවර්ධන නිලධාරී වෙත භාරදිය හැක. ඒ සඳහා ක්ෂේත්‍ර ලැබීම් රිසිට් පතක් අදාල නිලධාරියා විසින් නිකුත් කල යුතුය.

12 අක්‍රිය ණය (Non Performing Loan- NPL) හඳුනා ගැනීම සහ ගනු ලබන ක්‍රියාමාර්ග.

12.1 යම් ණය මුදලක් මාසිකව ගෙවීමට පොරොන්දු වූ විටක, ණය මුදලේ මාසික වාරිකය හෝ කන්නය අවසානයේදී ගෙවීමට පොරොන්දු වූ ණය මුදලක් හෝ බැංකුවට ගෙවිය යුතු දිනය ඉක්මවා දින 14 ක් ගිය පසුවත්, අදාල ණය මුදල හෝ මාසික වාරිකය සමඟ පොලිය තවදුරටත් ගෙවීම පැහැර හැර ඇත්නම්, අදාල පාර්ශවවලට ලිඛිතව දැනුම්දීම සිදු කළ යුතුය. ඒ සඳහා ඇමුණුම් 05 ආකෘතිය භාවිතා කර, පළමු නිවේදනය ණයකරු ඇතුළු පාර්ශව වෙත තැපැලෙන් හෝ අතින් භාරදීම සිදු කළ යුතුය. අතින් භාරදුන් විට, භාරගත් බවට සහතික කර ගැනීමට වැඩ පිළිවෙලක් සකස් කර ගත යුතුය.එමෙන් ම පුද්ගල ඇප මත ලබා දුන්ණය මුදල් සඳහා ද මෙම උපදෙස් අදාල කර ගත යුතු ය. යම් විටෙක පොලිය පමණක් ගෙවූ විටක දීද, මෙම නිවේදන නිකුත් කල යුතුය.

12.2 පළමු නිවේදනය නිකුත් කල පසු, ණය සංරක්ෂණ වැඩසටහන යටතේ ස්වාභාවික හේතුවක් මත වන්දි ප්‍රතිලාභ හිමිවන සිදුවීමක් / සිදුවීම් කිහිපයක් හේතු කරගෙන ණය පැහැර හැර ඇති බවට දැනගැනීමට ලැබූ විටක, සත්‍ය බවට තහවුරු කරගෙන ස්වාභාවික හේතූන් මත පැහැර හැර ඇති ණයක්ලෙසවෙන් කර යුතුය. ඒ සම්බන්ධව පාලක මණ්ඩලය වෙත වාර්තා කල යුතුය.

12.3 ස්වාභාවික හේතූන් මත පැහැර හැර ඇති ණය මුදලක් බව දැන ගැනීමෙන් පසුව, ඒ සම්බන්ධ ණය සංරක්ෂණ වැඩසටහන, යටතේ දී ඇති උපදෙස් පරිදි, ණය සංරක්ෂණ ප්‍රතිලාභ ලබාගැනීමට බැංකු කළමනාකරු ඇතුළු කාර්ය මණ්ඩලය ක්‍රියා කල යුතුය.

12.4 ඉහත කී ඡේද අංක 12.2 පරිදි ස්වාභාවික හේතූන් මත නොව සිතාමතා හෝ වෙනත් හේතූන් මත ණය නොගෙවීමට කටයුතු කර, ණය ගෙවීමට යහපත් ප්‍රතිචාර නොදක්වන විටක තවදුරටත් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. පළමු නිවේදනය නිකුත් කර දින 14කින් අනතුරුව දෙවන දැනුම්දීම (ඇමුණුම් 06 ආකෘතිය) සකස් කර,දී ඇති උපදෙස් පරිදි ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් භාරදීම සිදු කළ යුතුය.

12.5 දෙවන දැනුම්දීම සිදුකර, ණයකරු ඇතුළු ඇප අත්සන් කරන ලද කණ්ඩායමේසියළුම සාමාජිකයින්ගේ සාමාජික තැන්පත්/ සමූහ තැන්පත් ගිණුම්වල ඇති තැන්පතු මුදල් මෙන්ම ණයකරු නමින් වෙනත් ගිණුම්වල ද ඇති තැන්පතු මුදල් ද මුදාහැරීමතාවකාලිකව අත්හිටුවීම සහ කණ්ඩායම් සාමාජිකයින්ට නව ණය නිකුත් කිරීම ද, තාවකාලිව නතර කිරීමට කටයුතු කළ යුතුය.

12.6 දෙවන දැනුම්දීමට, ණයකරු යහපත් ප්‍රතිචාර දක්වා, පොලි මුදල සමඟ හිඟ ණය වාරික ගෙවා අවසන් කරන හෝ ලිඛිතව ඉදිරි දිනක ණය ගෙවීමට පොරොන්දු වූ විට, (ඇමුණුම් - 07) ඉහත ඡේද අංක 12.5 බැඳීම් ලිහිල් කරනු ලැබිය යුතුය.

12.7 දෙවන නිවේදනයට ද යහපත් ප්‍රතිචාර නොදක්වන හෝ ලිඛිතව දුන් පොරොන්දුව කඩ කරන විටක, දෙවන නිවේදනයෙන් දින 21 ක් ඉක්බිතිව අවසාන නිවේදනය (ඇමුණුම් 08) යැවීමට කටයුතු කල යුතුය. ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් භාරදීම සිදු කල හැක. එහිදි භාරගත් බවට සහතිකයක් ලබාගත යුතුය. එම අවස්ථාවේදි ද, කණ්ඩායම් සාමාජිකයින්ට පනවා ඇති සම්බාධක තවදුරටත් ඉදිරියට ගෙන යනු ලබයි.

12.8 තුන්වන නිවේදනය නිකුත් කර, එම දැනුම්දීමට දින 21 ඉක්මවීමට පෙරාතුව, හිඟ ණය වාරික සහ පොලි මුදල ගෙවා අවසන් නොකරන හෝ ගෙවීමට ලිඛිතව එකඟ නොවන අවස්ථාවක ණයකරු නමින් ඇති වෙනත් තැන්පතු (අනිවාර්ය ඉතිරි කිරීම් තැන්පතු හැර) සහ ඇප අත්සන් කරන ලද කණ්ඩායම් සාමාජිකයින්ගේ තැන්පතු මුදල් වලින් පැහැර හැරි මුළු ණය මුදල සහ ඊට අදාළ පොලී මුදල (දඩ මුදල සමග) අයකර ගැනීමට සිදු වේ.

12.9 තුන්වන නිවේදනය යවා දින 21 න් අනතුරුව, ණයකරුගේ තැන්පතු ගිණුම් වලින් සහ ඇපකරුවන් වූ කණ්ඩායම් සාමාජිකයින්ගේ සාමාජික තැන්පත් ගිණුම් සහ සමූහ තැන්පත් ගිණුමේ රැස් වී ඇති මුදලින් ණය මුදල, පොලිය සහ දඩ පොලිය අයකර ගත යුතුය. ප්‍රථමයෙන් පොලිය සහ දඩ මුදල අයකරගෙන ඉතිරි වන මුදලින් ණය මුදල අඩු කරගත යුතුය. ඉන් අනතුරුව ලිඛිතව කණ්ඩායම් සාමාජිකයින්ට දැනුම්දීමට පියවර ගත යුතුය.

12.10 ඡේද අංක 12.9 හි උපදෙස් අනුගමනය කල පසුව ද ඉතිරි වන ණය මුදල "හිතාමතා පැහැරි ණයක්" ලෙස හඳුනාගෙන කල්පසු වූ ණය රෙජිස්තරයේ සටහන් කල යුතුය.

12.11 කල්පසු වූ ණයකරුවන්ගේ, සාමාජික තැන්පත් ගිණුමෙහි සහ ණය ගිණුමෙහි රතු අකුරින් "හිතාමතා පැහැර හැරි ණය" ලෙස සටහන් කල යුතුය. පරිගණක මෘදුකාංගය විසින්, මෙම කටයුතු ස්වයංක්‍රියව හඳුනාගෙන, අදාල පොත්පත්වල සටහන් වේ.

12.12 කල්පසු වූ ණය රෙජිස්තරය සටහන් කරන තොරතුරු මාසික ණය වාර්තා සකස් කිරිමේදී, සිතාමතා කල්පසු වූ ණය ප්‍රමාණය ගණනය කිරීමට ද උපයෝගි කර ගනී.

12.13 තුන්වන නිවේදනය නිකුත් කර දින 21 ගිය පසුව දී ඇති උපදෙස් පරිදි යම් මුදලක් අයකරගත් පසුව ද, ඉතිරි ණය මුදල අයකර ගැනීමට ණයකරුටඑරෙහිවපළමු නෛතික ක්‍රියාමාර්ග ලෙස සමථ මණ්ඩලය සඳහා පැමිණිලි කල යුතුය. ඒ සඳහා සමථ මණ්ඩල සභාපති සමඟ සාකච්ඡා කර, පැමිණිලි ගොනුව සකස් කර ඉදිරිපත් කළ යුතුය. පැමිණිලි කිරීම සඳහා ආකෘතිය (ඇමුණුම් 09) භාවිතා කල යුතුය.

12.14 පැමිණිල්ල විභාග කිරිමේදී, පුද්ගලිකව බැංකු කළමනාකරු/ සහකාර කළමනාකරු බැංකුව නමින් පෙනි සිට නොපියවූ ණය මුදල සහ අයවිය යුතු පොලි මුදල අයකර ගැනීමටකටයුතු කළ යුතුය. අයවිය යුතු පොලි මුදල ගණනයේදී, පැමිණිල්ල සමථයට පත් වූ දිනය දක්වා වූ අදාල දින ගණනටපොලිය සකස් කළ යුතුය.

12.15 සමථ මණ්ඩලයට ඉදිරිපත් කළ පැමිණිලි පරීක්ෂා කිරීමේ දී, ණයකරු ස්වාභාවික ආපදාවකට/ රෝගී තත්ත්වයක සිටින බවට(ණය සංරක්ෂණ ප්‍රතිලාභ නොලබන) ඉදිරිපත් කරන කරුණු මත හෝ සහන ඉල්ලා සිටින විටකදී සලකා බලා පහත එක් සහනයක් ලබාදීමට, බැංකු පාලක මණ්ඩල අනුමැතිය මත කළමනාකරුට බලය ඇත.

I. ගෙවිය යුතු දඩ මුදල කපා හැරීම.
II. සමථයට පත් වූ දිනය දක්වා එකතු වූ පොලි මුදල සහ නොපියවූ ණය මුදල සමාන මාසික වාරික 09 ඇතුලත ගෙවා අවසන් කිරීම ඉඩදීම.
III. ගෙවා ඇති සහ ගෙවීමට ඇති ණය පොලි මුදල් වල එකතුව මුදාහල ණය මුදල ඉක්මවා යන විටක, ඉක්මවා යන ණය පොලි මුදල ඉවත් කර,සමාන මාසික වාරික 09 තුල ගෙවා අවසන් කිරීම.
IV. ඉහත කරුණු 02 හෝ 03 දක්වා ඇති සහන එකක් (01) සමඟ නොපියවූ ණය මුදල්වලට එකතුවූ දඩ පොලිය ඉවත් කිරීමට ඉඩදෙනු ලැබේ.

12.16. අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම.

12.16.1 සමථ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරිමෙන් අනතුරුව, පැමිණිල්ල බේරුම් කර ගැනීමට නොහැකි වූ අවස්ථාවක, බේරුම් කර ගැනීමට නොහැකි බවට සහතිකය ලබාගත යුතුය.

12.16.2 සමථ මණ්ඩලයේ දී බේරුම් කරගැනීමට නොහැකි වූ ඉන් අනතුරුව එම පැහැර හැර ණයකරුවන් සම්බන්ධව අධිකරණ ක්‍රියාමාර්ග ගත යුතුය. ඒ සඳහා ණයකරු සම්බන්ධව පහත ලියවිලි ඇතුලත් ණය ගොනුව සකස් කර ගත යුතුය.

I. ණය ඉල්ලුම්පත්‍රය
II. ණය ගිවිසුම්
III. ඇපකරු ප්‍රකාශන
IV. ණය පැහැර හැරීම සම්බන්ධ ලිඛිත දැනුම්දීම් ලිපි
V. සමථ මණ්ඩල විසින් ලබාදෙන බේරුම් කිරීමට නොහැකි බවට ලබාදෙන සහතික.
VI. සමෘද්ධි බැංකුව පිහිටුවීම සහ මෙහෙයුම් කටයුතු කිරීමට නෛතික බලය ලැබී ඇති පනත් සහ නියෝග.
VII. පොරොන්දු නෝට්ටුව.

12.16.3 නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටුව/ පාලක මණ්ඩලය වෙතින් ලබාදෙන අනුමැතිය මත සුදුසු නීතිඥයෙකුතෝරා ගැනීම සිදු කළ යුතුය.

12.16.4 තෝරාගත් නීතිඥවරයා මඟින් පළමුව "එන්තරවාසියක්" ණයකරු වෙත යොමු කිරීම සහ ණයකරුගේ ප්‍රතිචාරය අනුව, පැහැර හරින ලද ණය මුදල නොගෙවන විටක, ඊළඟ පියවර ලෙස අධිකරණ වෙත පැමිණිල්ල යොමු කිරීම.

12.16.5 තෝරා ගත් නීතිඥවරයා හරහා අධිකරණය වෙත පැමිණිලි කිරීමට අවශ්‍ය ලිපි, තොරතුරු ලබාදීම.

12.16.6 නොපියවූ ණය මුදල සහ අධිකරණ තීන්දුව ලබාදෙන දින දක්වා අයවිය යුතු පොලි මුදල ණයකරුගෙන් එකවර ලබාගැනීමට ඉල්ලුම් කල යුතුය. යම් හෙයකින් අධිකරණය මඟින් සහනයක් සලසන ලෙස ලබාදෙන නියෝගය මත පහත එක් සහනයක් ලබාදීමට හැකි බවට දැනුම්දිය හැක.

I. දඩ මුදල අතහැර දැමීම.
II. නොපියවූ ණය මුදල සහ අයවිය යුතු පොලී මුදල සමාන වාරික වශයෙන් මාස 09 ඇතුලත ගෙවීමට අවස්ථාව ලබාදීම.
III. ණයකරු ගෙවා ඇති සහ ගෙවීමට ඇති ණය පොලි මුදල්වල එකතුව ප්‍රදානිත ණය මුදල ඉක්මවන විටක, ඉක්මවන පොලි මුදල අතහැර දැමීම සහ පිටහිටි ණය මුදල සහ පොලි මුදල (ගෙවිය යුතු පොලී මුදලක් ඇත්නම්) එකතු කරසමාන මාසික වාරික 09 ගෙවීමට ඉඩදීම.
IV. ඉහත කී IIසහ III අතරින් සහන එකක් (01) සමඟ ගෙවිය යුතු දඩ මුදලක් ඇත්නම් අතහැර දැමිය හැක.

12.16.7 රාජ්‍ය සේවකයින්ගේ ඇප සුරැකුම මත ලබාදුන්, ණය මුදලක ණයකරුවෙකු ණය මුදල පැහැර ඇති විටක, ඉහත කී නිවේදන I, II, III නිකුත් කල පසුව ද හිඟ ණය මුදල් නොගෙවන විටක, ඇපකරුවන්ගේ සේවය නිරත ආයතනයේ ප්‍රධානියා වෙත දැනුම් දී, වැටුපෙන් අය කරගැනීමට කටයුතු කල යුතුය. එයටද ප්‍රතිචාර නොදක්වන විටක, අධිකරණ ක්‍රියාමාර්ග සඳහා අවශ්‍ය කටයුතු කළ යුතුය.

12.16.8 චංචල/ නිශ්චල දේපල ඇප මත ලබාදුන් ණය මුදල් ද හිතා මතා ණය පැහැර හැර ඇත්නම්, ඉහත කී උපදෙස් අනුපිළිවලට ක්‍රියාමාර්ග ගත යුතුය. අධිකරණ මඟින්, දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියෝග කරන විටක, ලැබෙන ආදායම මඟින් පොලි මුදල සහ පිටහිටි ණය මුදල අයකර ගත යුතුය.

12.16.9 ආදායම් බදු ගෙවන පුද්ගලයකු විසින් ඇප සුරැකුම අත්සන් කර ඇති විටක ඉහත කී පරිදි ණයකරු ඇතුළු පාර්ශව දැනුම් දීම් සිදුකළ පසුවද, ණය නොගෙවන විටක අධිකරණ ක්‍රියාමාර්ගවලට එළඹ ණය අය කර ගත යුතුය.

12.16.10 එක් සාමාජිකයෙකු, ණය වැඩසටහන් කිහිපයක් යටතේ, ණය මුදල් ලබාගෙන, එක් ණය මුදලක් හෝ පැහැර හැර ඇත්නම්, එම ණයකරු ණය පැහැර හැර අයෙකු ලෙස සලකා නව ණය ලබාදීම සිදු නොකල යුතුය.

12.16.11 යම් විටෙක, එකම දේපලක් ඇප සුරැකුම ලෙස තබාගෙන ණය මුදල් කිහිපයක් ලබා දී ඇති විටෙක, එක් ණය මුදලක් වෙනුවෙන් දේපල වෙන්දේසි කර, ණය මුදල පියවා ගැනීමේ දී, අනෙකුත් නොපිය වූ ණය මුදල් ද පියවා ගත යුතුය.

12.16.12 ණය පැහැර හැරි ණයකරුවන් වෙනුවෙන්, පුද්ගලික ණය ගොනුවක් නඩත්තු කල යුතුය. එය සුරක්ෂිතව තැබීම සිදු කළ යුතුය.

13. පැහැර හැර ඇති ණය මුදල්, බොල් ණය ගිණුමට මාරු කිරීම සහ වෙන් කිරීම්.

13.1 අවදානම් සහිත ණයකරුවන් හඳුනා ගැනීමට වැඩි අවධානයක් දැක් විය යුතුය.බැංකුවේ සත්‍ය මූල්‍ය ප්‍රකාශය සකස් කිරීම සඳහා සිතාමතා ගෙවීම් පැහැර හැරි ණය මුදල්, බොල් ණය ගණයට මාරු කිරීම සිදු කල යුතුය.

13.2 ඡේද අංක 12හි සඳහන් පරිදි කටයුතු කර තවදුරටත් නොපියවූ ණය මුදලේ පිටහිටි ණය මුදල හි ගිවිසුම් ගත වූ වාරිකය ගෙවීම පැහැර හැරි දිනයේ සිට මාස 09 සම්පූර්ණ වීමෙන් පසුව ද, කන්නය අවසානයේ ආපසු ගෙවීමට ලබාගත් කෘෂිකාර්මික ණය මුදලක් නම්, මුදල ගෙවීමට නියමිතව තිබූ දිනයේ සිට මාස 09 ක කාලයක් ගතවීමෙන් පසුව ද ණය නොගෙවන විටක බොල් ණය ගණයට මාරු කිරීම සිදු කළ යුතුය. එනම් මාස 09 ඉක්ම වූ දිනයට පසු දින, බොල් ණය මුදලක් ලෙස සැලකිය යුතුය.

13.3 පරිගණක භාවිතා නොකර මෙහෙයුම් කටයුතු කරන Manual Operation බැංකු විසින්, වසරේ සෑම කාර්තුවකට වරක් වැඩ කරන අවසාන දිනයේදී ඉහත ඡේද අංක 13.02 හි පරිදි, ණයකරුවන් හඳුනාගෙන එක් එක් ණයකරුගේ එදිනට පිටහිටි ණය මුදල (නොපිය වූ ණය මුදල) ක්‍රියාකාරි (Active) ණය ගිණුමෙන්, බොල් ණය ගිණුමට මාරු කළ යුතුය. ඒ සඳහා පැවැරුම් පත්‍ර භාවිතා කර පහත සටහන තැබිය යුතුය. එහිදි පොදු ලෙජරයේ එක් එක් ණය වැඩසටහන් සඳහා බොල් ණය ගිණුම් විවෘත කල යුතුය. පරිගණක මෘදුකාංගය හරහා කටයුතු කරන බැංකුවලට, ස්වයංක්‍රියව දිනපතා බොල් ණය ගිණුමට මාරුවීම සිදු වේ.

බොල් ණය වෙන්කිරීම සඳහා වූ ගිණුම් සටහන පහත වේ.

| | | |
|---|---|---|
| බොල් ණය ගිණුම - ජීවනෝපාය සංවර්ධන / සමෘද්ධි සම්පත/ පාරිභෝගික/ ආපදා.... ණය ගිනුම | - | හර |
| ලැබිය යුතු - ජීවනෝපාය සංවර්ධන / සමෘද්ධි සම්පත/ පාරිභෝගික/ ආපදා .... ණය ගිණුම | - | බැර |

එසැනින්, පුද්ගලික ණය ලෙජරය සහ ණයකාඩ් පත හි ''බොල් ණය'' ගිණුමක් ලෙස රතු පැනෙන් සටහනක් තැබිය යුතුය. දැනටමත් පොදු ලෙජරයේ බොල් ණය සඳහා කේත අංක ලබාදී ඇත. එම අංක භාවිතා කළ යුතුය. ඒ ඒ ණය වැඩසටහන් යටතේ, බොල් ණයකරුවන් සඳහා වෙනම පුද්ගලික ණය ලෙජර් භාවිතා කළ යුතුය.

13.4 බොල් ණය සඳහා වෙන් කිරීම.

ඉහත ඡේද අංක 13.03හි සඳහන් පරිදි, බොල් ණයකරුවන් සහ මුදල හඳුනාගත් පසු, ඒ සඳහා වැය දැරීමට සඳහා බොල් ණය වෙන් කිරීම සිදු කළ යුතුය. පොදු ලෙජරයේ පහත ගිණුම් විවෘත කර, පැවරුම් පත්‍ර භාවිතා කර, බොල් ණය ප්‍රමාණය සඳහා වැය ප්‍රතිපාදන වෙන් කල යුතුය.

| | |
|---|---|
| වැය ගිණුම- බොල් ණය වෙන් කිරීම | - හර (කේත අංකය 2110) |
| බොල් ණය වෙන් කිරීමේ සංචිත ගිණුම | - බැර (කේත අංකය 4025) |

එසැනින්, පුද්ගලික ණය ලෙජර්, බොල් ණයකරුවන්ගේ රෙජිස්තරය සහ බොල් ණය පාලන ලෙජර්වල දී ඇති උපදෙස් පරිදි සටහන් තබා, උපයෝගි ලෙජර් සහ ලේඛණනඩත්තු කල යුතුය. පරිගණක මෘදුකාංගය විසින්, මෙම කාර්යයන් ස්වයංක්‍රියව සිදු කරන බව ද, එහිදි කාර්ය මණ්ඩල විසින් නිසි උපදෙස් අනුගමනය කල යුතුය.

13.5 එක් එක් ණය වැඩසටහන්වලට අදාලව බොල් ණය ගිණුම්වල දැක්වෙන අගයන්වල එකතුව, බොල් ණය වෙන් කිරීමේ සංචිත ගිණුමෙහි ශේෂයට සමාන විය යුතුය. අසමතුලිත තත්ත්වයන් දක්නට ලැබෙන විටක එය සොයා බලා නිවැරදි කළ යුතුය.

13.6 බොල් ණය මුදල් ආපසු අයකර ගැනීම.

13.6.1 පසු කාලීනව, බොල් ණය මුදල හෝ කොටසක් අය කරගත් විටක, ණය මුදලෙහි වාරිකය ඒ ඒ බොල් ණය ගිණුමට ද, අය කර ගත් පොලී මුදල ලද පොලිය - දුන් ණය ගිණුමෙහි සටහන් කල යුතුය. දඩ මුදලක් අයකරන විටක එම ආදායම ලද පොලිය - දුන් ණය ගිණුමෙහි බැරට සටහන් තැබිය යුතුය. ඒ සඳහා ප්‍රවේශන සටහන පහත වේ.

| | |
|---|---|
| සාමාජික තැන්පත් ගිණුම | - හර |
| බොල් ණය ගිණුම - ජීවනෝපාය සංවර්ධන/ සමෘද්ධි සම්පත/ කෘෂිකාර්මික/ ආපදා ........... ණය ගිණුම් | - බැර |
| ලද පොලිය - දුන් ණය ගිණුම | - බැර |

13.6.2 ඉන් අනතුරුව බොල් ණයකරුවන්ගේ රෙජිස්තරයේ අදාල ස්ථානවල සටහන් තබා, ගණුදෙනුව සම්පූර්ණ කල යුතුය.

13.6.3 බොල් ණයමුදල් අය වු පසුව එම අවස්ථාවේ දී හෝ සෑම කාර්තුවක් අවසානයේදී, බොල් ණය ගිණුම හි ශේෂය (හර ශේෂ එකතුව) සහ බොල් ණය වෙන් කිරීමේ සංචිත ගිණුමේ පෙන්නුම් කරනශේෂය සමඟ සන්සන්දනාත්මකව තුලනය කර, බොල් ණය වෙන් කිරීමේ සංචිත ගිණුමේ බැර ශේෂයේ අතිරික්තය පහත පරිදි පැවරුම් පත්‍ර භාවිතයෙන් ආදායම් ගිණුමකට මාරු කල යුතුය.

| | |
|---|---|
| බොල් ණය වෙන් කිරීමේ සංචිත ගිණුම | - හර |
| ලද ආදායම් - බොල් ණය ආපසු අයකර ගැනීම් ගිණුම | - බැර (කේත අංකය 1009) |

13.6.4 මෙම සංසිද්ධිය, පරිගණක මෘදුකාංගය මඟින්, ස්වයංක්‍රියව *සිදුවන බව දන්වමි.*

14.0 ප්‍රගති වාර්තා සකස් කිරිම සහ වාර්තා යොමු කිරිම.

14.1 සමෘද්ධි ප්‍රජාමුල බැංකුව විසින් මුදාහරින ණය හා අයකර ගැනීම මෙන්ම කල්පසු සහ පැහැර හැරි ණය පිළිබඳ වාර්තා සකස් කල යුතුය.

14.2 පරිගණක මෘදුකාංගය හරහා කටයුතු සිදු කරන බැංකු සඳහා වාර්තා පිළියෙල කර ගැනීමට පහසුකම් සලසා ඇත.

14.3 වාර්තා සකස් කිරීම තුලින් අපේක්ෂා කරන කරුණු

I. කළමනාකරණ තිරණ ගැනීම සඳහා තොරතුරු ඉදිරිපත් කිරීම.
II. ප්‍රගතිය මැන බැලීම සහ පසු විපරම් කිරිම.
III. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ඇතුළු, ඇල්මක් දක්වන පාර්ශවවලට යොමු කිරිම.
IV. විගණන සහ අධීක්ෂණ අංශවලට ඉදිරිපත් කිරිම.

14.4 සෑම මසක් අවසන් වී එළඹෙන මාසයේ 05 වෙනිදා හෝ ඊට පෙර ඇමුණුම 10ආකෘතිය අනුව වාර්තාව පිළියෙල කර, ප්‍රජාමුල බැංකු සමිතිය වෙත යොමු කළ යුතුය. එමෙන්ම, එක් පිටපතක් සමෘද්ධි බැංකුවෙහි සුරක්ෂිතව ගොනු කල තැබිය යුතුය.

14.5 වාර්තා සකස් කිරිමේදී, ණය සම්බන්ධව පවත්වාගෙන යන රෙජිස්තර ඇතුළු පොත්පත් ආශ්‍රයෙන් තොරතුරු ලබාගැනීමටත්, ඉදිරිපත් කරන තොරතුරුවල නිවැරදිභාවය පරීක්ෂා කිරිම ද සිදු කල යුතුය.

14.6 සමෘද්ධි බැංකුවල ණය සම්බන්ධ තොරතුරු පිළිබඳ පාලක මණ්ඩල සහ විධායක කමිටු රැස්වීම්වලදී සමාලෝචනය කිරීම සහ අවශ්‍ය මඟ පෙන්වීම් සිදු කල යුතුය.

14.7 සමෘද්ධි ප්‍රජාමුල බැංකු සමිති විසින්, තම බල ප්‍රදේශයට අයත් සියළුම බැංකුවල තොරතුරු රැස්කර ඇමුණුම 11 හි ආකෘතියට වාර්තාව පිළියෙල කර, සෑම මසක් අවසාන වී, එළැඹෙන මාසයේ 10 වෙනිදා හෝ ඊට පෙර දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත යැවිය යුතුය.

14.8 දිස්ත්‍රික් සමෘද්ධි අංශය විසින් ද ඇමුණුම් 11 ආකෘතියටම අනුව සෑම මසක්ම අවසාන වී එළැඹෙණ මස 15 දින හෝ ඊට පෙර mfdyear2015@gmail.comවිද්‍යුත් ලිපිනය හරහා සමෘද්ධි ප්‍රජාමුල බැංකු අංශයට එවිය යුතුය.

14.9 ප්‍රගතිය සකස් කරන සමෘද්ධි බැංකු/ බැංකු සමිති /දිස්ත්‍රික් සමෘද්ධි අංශය යන සියලුම අංශ වාර්තා සකස් කිරිමේදී සහ යොමු කිරීමේ දී වාර්තාවල නිවැරදිභාවය සහ සත්‍යතාවය පිළිබඳ වැඩි අවධානයක් යොමු කල යුතුය.

14.10 අධිකරණය විසින්, ලිඛිතව ලබාදෙන නියෝගය මත හැර, අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියකින් තොරව, වෙනත් බාහිර ආයතන හෝ පුද්ගලයින්ට ණය සම්බන්ධ තොරතුරු හෝ ණයකරුවන් පිළිබඳ තොරතුරු ලබාදීම නොකල යුතුය.

15. ප්‍රගති සමාලෝචන පැවැත්වීම සහ පසු විපරම් කිරිම.

15.1 ප්‍රගති වාර්තාව පිළියෙල කර, පාලක මණ්ඩල සාමාජිකයින් සහ වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරින් සහභාගි කරගෙන ප්‍රගති සමාලෝචන රැස්වීම් මාස 02 කට වරක් සමෘද්ධි ප්‍රජාමුල බැංකු මට්ටමින් පැවැත්විය යුතුය. එම කටයුතු සම්බන්ධිකරණය බැංකු කළමනාකරුට පැවැරෙන අතර, ඒ සම්බන්ධ වාර්තා සුරක්ෂිතව තැබිය යුතුය.

15.2 සමෘද්ධි ප්‍රජාමුල බැංකු සමිති විසින් ද, සමෘද්ධි බැංකු මඟින් ක්‍රියාත්මක ණය වැඩසටහන් ඇතුළු අනිකුත් කාර්යයන් ද සම්බන්ධ කර, සෑම මාස 03 ට වරක්, සමෘද්ධි බැංකු කළමනාකරුවන්, වසම්භාර සමෘද්ධි සංවර්ධන නිලධාරින්, විධායක කමිටු සාමාජිකයින් ඇතුළු වෙනත් නිලධාරින් රැස් කර ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්විය යුතුය. මෙම කටයුතු පිළිබඳ තොරතුරු ගොනු කර සුරක්ෂිතව තැබිය යුතුය.

16. කෘෂිකාර්මික, සත්ත්ව පාලන ව්‍යාපෘති සඳහා ඇති විය හැකි අවදානම අවම කරගැනීම සඳහා අදාල ව්‍යාපෘති සඳහා ණය ලබාදීමේදී, සමෘද්ධි වැඩසටහන යටතේ ක්‍රියාත්මක ණය සංරක්ෂණ වැඩසටහනට අමතරව, කෘෂි රක්ෂණ මණ්ඩලය මඟින් හෝ ඒ සම්බන්ධ රජයේ ආයතන මඟින් ක්‍රියාත්මක රක්ෂණ වැඩසටහන් යටතේ රක්ෂණ ආවරණයක් ලබාගැනීමට ප්‍රතිලාභීන් දැනුවත් කර යොමු කිරීම සහ අදාල ආයතන සම්බන්ධීකරණය කිරීම සමෘද්ධි බැංකු කාර්ය මණ්ඩලයේ වගකීමක් වේ.

17. ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා ණය ප්‍රදානය කිරිමේදී, විශේෂ දැනුම, පුහුණු කිරිම්, තාක්ෂණික උපදෙස් ලබාදෙන පහත ආයතනවල සේවා පහසුකම් ලබාගැනීමට කටයුතු කල යුතුය.

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- ගොවිජන සේවා මධ්‍යස්ථානය
- තේ/පොල්/රබර් බෝග සම්බන්ධ රජයේ ආයතන
- පුහුණු පහසුකම්, තාක්ෂණික පහසුකම් සලසන වෙනත් ආයතන
- පශු වෛද්‍ය කාර්යාලය
- විදතා මධ්‍යස්ථානය
- සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව
- කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

18. යම් සමෘද්ධි බැංකුවක, ණය පැහැර හැරිම් ප්‍රතිශතය 5% හෝ ඊට වැඩි අවස්ථාවක හෝ ග්‍රාම වසමක/ ප්‍රජාමුල සංවිධානයක ණය පැහැර හැරිම ඉහල අගයක් ගන්නා විටක "ණය අවදානම් කළමනාකරණ" කමිටුවක් සමෘද්ධි ප්‍රජාමුල බැංකු සමිතිය විසින් පිහිටුවිය යුතු අතර, එහි සංයුතිය පහත වේ. මෙම කමිටුව මඟින් පැහැර හැරි ණය මුදල් අයකර ගැනීම, නෛතික ක්‍රියාමාර්ග ගැනීමට හවුල්වීම ඉදිරියේදි එවැනි තත්ත්වයක් ඇතිවීම වැළැක්වීම පාලනය සඳහා කටයුතු කල යුතුය.

I. බැංකු සමිති කළමනාකරු (සභාපති)
II. බැංකු සමිති විධායක කමිටු සභාපති
III. පාලක මණ්ඩල සභාපති
IV. බැංකු කළමනාකරු
V. සමෘද්ධි බැංකුවේ ණය විෂය ලිපිකරු

මෙහිදි ප්‍රවාහන, ලිපිද්‍රව්‍ය, සංග්‍රහ වැනි සුළු වියදම් සඳහා පාලක මණ්ඩල අනුමැතිය මත බැංකුවෙන් වියදම් දැරීමට ඉඩදෙනු ලැබේ.

19. ණය බැඳිම් සහිත බැංකු සාමාජිකයින් ස්ථිර පදිංචිය මාරුවීම.

19.1 පාලක මණ්ඩල අනුමැතිය මත ක්‍රියාකාරි පිටහිටි ණය මුදලක් ඇති බැංකු සාමාජිකයෙකු බැංකු දෙකක් (02) අතරේ හුවමාරු කර ගැනීමේ දී ණය බැඳිම සහිත ණයකරුගේ වගකීම භාරගන්නා බැංකුව, පවරාදෙන බැංකුවට මුදලින් ණය බැඳිම ගෙවා අවසන් කල යුතුය. කල්පසු වූ සහ බොල් ණයකරුවන් සඳහා මෙම උපදෙස් වලංගු නොවන අතර, කල්පසු ණයකරුවෙක් නම්, කල්පසු ණය වාරික සහ පොලි මුදල් අදාල බැංකුවට පළමු ගෙවා අවසන් කල යුතුය. එමෙන්ම චංචල/ නිශ්චල දේපල සුරැකුම් මත ලබාදුන් ණය මුදලක් නම්, නීතිමය උපදෙස් මත අවශ්‍යතා සංශෝධන සිදු කරගත යුතුය.

එහිදි ණය බැඳිම සමග බැංකු සමාජිකයා භාරගැනිමේදි ගිණුම් සටහන පහත වේ.

| | | |
|---|---|---|
| ලැබිය යුතු - ජීවනෝපාය සංවර්ධන/සමෘද්ධි සම්පත්/ ............ ණය ගිණුම | - | හර |
| මුදල් / ජංගම ගිණුම | - | බැර |

19.2 ණය මුදල භාර ගන්නා බැංකුව, නව ණය මුදලක් නිකුත් කිරිමේදී අනුගමනය කරන ලෙජර්, රෙජිස්තරය ආදිය නඩත්තු කල යුතු අතර, පැරණි ණය ඉල්ලුම් පත්‍රය සහ ගිවිසුම් තවදුරටත් වලංගු වේ. මෙහිදී, සුරැකුම් පිළිබඳ අවධානමක් ඇති විටක නව සුරැකුම් ලබාගැනීමට සිදු කළ යුතුය. එමෙන්ම ව්‍යාපෘති ණය මුදලක් නම්, අදාල ව්‍යාපෘතිය සාර්ථකව තිබිය යුතුය. එමෙන්ම චංචල/නිශ්චල දේපල සුරුකුම් මත ලබා දි ඇති විටෙක,නිතිමය උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

19.3 2017 අංක 01 දරණ සමෘද්ධි නියෝග අංක 8 (1) අනුව ප්‍රජාමූල සංවිධානයක සාමාජිකත්වය අහෝසි, වුවද සමෘද්ධි බැංකුවෙහි ණය බැඳිම හෝ බැඳිම් අවසන් වනතුරු, බැංකු සාමාජිකත්වය හිමි වේ. එමෙන්ම සාමාජිකයෙකුගේ සාමාජිකත්වය අහෝසි වු අවස්ථාවක පත් වන අනුප්‍රාප්තිකයා නව සාමාජිකයෙකු ලෙස පත්විය යුතුය.

20 සෑම මාසයක් අවසානයේ දී එක් එක් ණය වැඩසටහන යටතේ ලබාදුන් ණය සඳහා ණයකරුවන්ගෙන් අය විය යුතු පිටහිටි ණය මුදල් ශේෂවල නිවරදාතාවය තහවුරු කරගැනීම සඳහා එක් එක් ණය වැඩසටහන යටතේ පිටහිටි ණයකරුවන්ගේ පුද්ගලික ණය ලෙජර්වල දැක්වෙන ශේෂ සහ පොදු ලෙජරයේ අදාල ණය ගිණුම්වල ශේෂය සමග තුලනය වන බවට තහවුරු කරගැනීම සඳහා කේවල ණය ශේෂ පිරික්සුම් ගත යුතුය. එම ශේෂ පිරික්සුම් තුලනය නොවන විටක තුලනය කිරීම අනිවාර්ය වේ. මෙම කාර්යය සෑම මාසයක් අවසන්වී එළඹෙන මස 15 වන දිනට පෙර නිම කල යුතුය. පරිගණක මෘදුකාංගය හරහා මෙම කාර්යය සිදු කරගැනීමට පහසුකම් සලසා ඇත.

ආර්.පී.කේ. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මුල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්/ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - අ.ක..ස.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
4. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
5. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස.
6. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - අ.ක.ස.
7. නියෝජ්‍ය අධ්‍යක්ෂ ( ප්‍රජාමූල සංවිධාන), සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
8. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.